# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

### තුන්වන ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## තුන් වන ශ්‍රේණිය

**(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

**බුද්ධ ධර්මය**

**තුන් වන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

ප්‍රථම මුද්‍රණය 2018

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info @ nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද, සුභාවිත තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද, මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද, අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ සහ සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුම ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක් වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි තේමා සහ නිපුණතා සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදවි වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද, දෙගුරුනට ද, භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරු භවතුන් පෙළ පොත හා මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයවල සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැ යි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය, පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය :**

**උපදේශකත්වය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමීන් වහන්සේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

ශාස්ත්‍රපති අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක මාහිමිපාණන් වහන්සේ
හිටපු කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය

ආචාර්ය පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම මාහිමිපාණන් වහන්සේ
කුලපති, කැලණිය විශ්වවිද්‍යාලයය

මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද ස්වාමීන් වහන්සේ
කැලණිය විශ්වවිද්‍යාලයය

පූජ්‍ය උඩුගම සුදස්සි ස්වාමීන් වහන්සේ
කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

එස්. බී. එම්. නිමල් ධර්මසිරි මහතා
අධ්‍යක්ෂ (ආගමික හා සාරධර්ම අධ්‍යාපන), අධ්‍යාපන අමාත්‍යාංශය

එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මහතා
අධ්‍යක්ෂ වැ.බ. (මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන)
ජාතික අධ්‍යාපන ආයතනය

**අනුමතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : සකුන්තලා රණසිංහ මිය - සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය :**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

සකුන්තලා රණසිංහ මිය, සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**බාහිර සම්පත් දායකත්වය**

පූජ්‍ය දමන සුගතධම්ම ස්වාමීන් වහන්සේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය.

කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මයා, විශ්‍රාමික අධ්‍යක්ෂ, ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

වයි. ඒ. ඩී. ගර්ටි විජේරත්න මිය, ප්‍රාථමික ගුරු උපදේශිකා, ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය.

ආර්. එච්. දීපිකා පෙරේරා මිය, ගුරු සේවය, බප/ජය/ධර්මාශෝක කනිටු විදුහල

කේ. ජී. ඉන්ද්‍රාණි ස්වර්ණලතා මිය, ගුරු සේවය, කො/උතුර ධර්මපාල විද්‍යාලයය

**භාෂා සංස්කාරක** : ශ්‍රීනාත් ගණේවත්ත මයා

**පරිගණක වදන් සැකසුම** : බී. ඒ. එන්. බටවල මිය

**විවිධ සහය** : ඩබ්ලිව්. එච්. ටී. සිල්වා මයා
එස්. පී. ඒ. සරත් කුමාර මයා

# හැඳින්වීම

ජාතික අරමුණු ඉටු කර ගැනීම සඳහා පාදක වන මූලික නිපුණතා ඇසුරින් 'ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා' දරුවන් තුළ ගොඩනැංවීම 'ආගම' විෂයයේ වගකීම වෙයි.

කුඩා දරුවකුගේ ළපටි මනසෙහි අලුත් යමක් රෝපණය කිරීම පහසු ය, එ සේ ම යහපත් චර්යාවලට සහ වත් පිළිවෙත්වලට කුඩා දරුවකු අනුගත කිරීම ද වඩා ඉක්මනින් කළ හැකි ය. කුඩා දරුවකු තුළ පවත්නා එම ගුණාංගවලට මනා ව ගැළපෙන සේ මෙහි විවිධ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත. විෂය අන්තර්ගතයට අනුකූල ව සිසු දරුවාට අදාළ නිපුණතාව ලබා දෙමින් ඉගෙනුම් පල සාක්‍ෂාත් කර ගැනීමට එම ක්‍රියාකාරකම් ඔබට මාර්ගෝපදේශයක් වනු ඇතැ යි අපේක්‍ෂා කෙරේ.

සමාජයක සාමය සහ සදාචාරය පවත්වා ගැනීමට සියලු ම ආගම්වලින් ලැබෙන දායකත්වය සුළුපටු නො වේ. තව ද, තමා හැම අයුරින් ම පෝෂණය කර ගුණාත්මක ජීවිතයක් ගත කිරීමට ශ්‍රම දායකත්වය සපයන මිනිස් සමාජයට කෘතවේදී වෙමින් පෙරළා අවංක සේවයක් කිරීමටත්, යහගුණවලින් හෙබි මනුෂ්‍යයකු ලෙස අභිමානයෙන් යුතු ව ජීවත් වීමටත්, ආගමකින් ලැබෙන පන්නරය අතිමහත් ය. එ පමණක් නො ව අප එකිනෙකා විශ්වාස කරන පරිදි මරණින් ඔබ්බෙහි දී ද යහපතක් උදා කර ගැනීම සඳහා ආගමික ඉගැන්වීම් අපට නිසැක ව ම පිහිට වෙයි.

දැහැමි සමාජයක් බිහි කිරීමේ උදාර කර්තව්‍යය ආරම්භ කළ යුත්තේ ප්‍රාථමික අවධියේ කුඩා දරුවා ගෙනි. ඒ මහඟු කර්තව්‍යය භාර ගෙන සිටින භාග්‍යවන්ත වූ ගුරුභවතා ඔබ යි. ඒ සඳහා ඔබෙන් ලැබෙන දායකත්වය සහ කැපවීම මහත් සේ අගයමු.

**එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න**
**අධ්‍යක්‍ෂ,**
**මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුම්වත් වීම සහ හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

## i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

## iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය


vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**


සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ප්‍රාථමික විෂයමාලා සැලැස්ම



# කාලය බෙදා ගැනීම

## දෙවන ප්‍රධාන අවධිය (තුන් වන සහ හතර වන ශ්‍රේණි)

| **විෂයය** | | **සතියකට වෙන් කර ඇති කාලය** |
|---|---|---|
| 1. | මවු බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 5.00 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 6.00 |
| 4. | ඉංග්‍රීසි | පැය 3.00 |
| 5. | දෙවන ජාතික භාෂාව | පැය 1.00 |
| 6. | ආගමය | පැය 2.00 |
| 7. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 |
| 8. | විවේක කාලය | පැය 1.40 |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 2.05 |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 (සතියේ එක් දිනෙක) |
| | **සතියක මුළු කාලය** | **පැය 27.30** |

# බුද්ධ ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනයට උපදෙස්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවෙන් දැක්වෙන ජාතික අරමුණු මෙම ශ්‍රේණියේ විෂය නිර්දේශ සැකසීම සඳහා පාදක කොට ගෙන ඇත. ජාතික පොදු අරමුණු කරා එළැඹීම පිණිස මූලික වන පොදු නිපුණතා ද එම වාර්තාවේ යෝජනා කර ඇත.

ප්‍රධාන වශයෙන් ආගමයට හා ආචාර ධර්මවලට අදාළ නිපුණතා මෙන් ම අනෙක් නිපුණතා ද දරුවන් තුළ ඇති කිරීමට බුද්ධ ධර්මය විෂයය මඟින් උසස් මෙහෙයක් කළ හැකි ය. අනාගත සංවර්ධනය නමැති ව්‍යූහය ගොඩ නැඟීම සඳහා බුද්ධ ධර්මය මඟින් ලබා දිය හැකි දායකත්වය අතිවිශාල ය.

ප්‍රාථමික අධ්‍යාපනයේ බුද්ධ ධර්මය විෂය නිර්දේශ සැකසීමේ දී අදාළ ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ වයස් මට්ටම, පරිණතිය, භාෂා හැකියා, රුචිකත්ව හා ළැදියා කෙරෙහි සැලැකිලිමත් වී තිබේ. අදාළ ශ්‍රේණියේ දරුවන්ට ළඟා විය හැකි නිපුණතා හා ඒ සම්බන්ධ විෂය කරුණුවලට පමණක් සීමා වී එම විෂය නිර්දේශ පිළියෙළ කිරීමට උත්සාහ ගෙන ඇත. එ සේ ම උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී අත්දකින්නට ද, ක්‍රියාකාරකම් මඟින් ඉඩ සලසා ඇත.

කුඩා දරුවකුට බුද්ධ ධර්මය ඉගැන්වීම දැඩි වගකීමක් සහිත ව කළ යුත්තකි. කුඩා අවදියේ ඉතා සුළු වූ හෝ කරුණක් සම්බන්ධයෙන් වැරැදි වැටැහීමක් ඇති වුව හොත් එය එම දරුවා ගේ මෙ ලොව ජීවිතයට පමණක් නො ව පරලොව ජීවිතයට ද බලපෑමට ඉඩ ඇත. එ බැවින් නොදන්නා හෝ සැකමුසු හෝ කරුණු ඇතොත් ඒ සියල්ල මැනැවින් දැන ගෙන නිවැරැදි දේ ම ඉදිරිපත් කිරීමට සියලු ගුරුවරුන් අනතිමානී විය යුතුවාක් මෙන් ම අවංක ද විය යුතු ය.

දරුවන් ගේ ජීවිතවලට ආදර්ශයක් වන පරිදි තමා ද යහපත් ජීවන පැවැත්මෙන් යුතු වෙමින් මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම ගුරුවරුන් ගේ වගකීම යි.

එක ම ගුරුවරයකු විසින් නම්‍ය කාල සටහනක් ක්‍රියාත්මක කිරීම මඟින් දරුවන්ට වඩාත් හිතකර ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගත හැකි ය.

**ප්‍රාථමික අවධිය සඳහා වන නිපුණතා**

1. බුදු රජාණන් වහන්සේ ගේ ශ්‍රේෂ්ඨත්වය හැඳින ගෙන චරිතායනය කරයි.
2. සුවිශේෂ බෞද්ධ චරිත හා ජාතක කථා හැඳින ආදර්ශයට ගෙන කටයුතු කරයි.
3. බෞද්ධ දරුවකු ගේ  අනන්‍යතාව තම චර්යා මඟින් ප්‍රදර්ශනය කරයි.
4. ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් අපේ සංස්කෘතික උරුමය රැක ගැනීමට දායක වෙයි.
5. බෞද්ධ ගුණ ධර්ම ඇසුරින් තමන්ටත් අනුන්ටත් හිත පිණිස වන පෞරුෂත්වයක් ගොඩනඟා ගනියි.
6. බෞද්ධ උපදේශ කාව්‍ය වණපොත් කර ගනිමින් ආදර්ශවත් ජීවිතයක් ගොඩනඟා ගනියි.
7. හිතකර දෛනික චර්යා රටාවක් ගොඩනඟා ගනිමින් සෞඛ්‍යවත් ජීවිතයක් ගත කරයි.
8. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවල යෙදෙමින් දැහැමි හා සැපවත් ජීවිතයක් ගත කරයි.
9. සුවිශේෂ බුදු වදන් හදාරමින් ධම්මචාරී ජීවිතයක් ගත කරයි.
10. ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධස්ථාන හැඳින ඒවා සුරකිමින් හා අගයමින් වන්දනා කරයි.

1 - 5 ශ්‍රේණි අවධියේ බුද්ධ ධර්මය පිළිබඳ ඉගෙනුම් අත්දැකීම් ලබන සිසුන්, ප්‍රාථමික අවධිය අවසාන කරන විට උක්ත නිපුණතාවලට ළඟා වනු ඇතැ යි අපේක්ෂා කෙරේ. ඒ සඳහා අදාළ විෂය අන්තර්ගතය, විෂය නිර්දේශවල දක්වනු ලබන අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා යෝජනා කර ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය වඩාත් නිර්මාණශීලී ව භාවිත කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අත්දැකීම් ලබාගැනීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක් ලෙස පමණක් පෙළ පොත යොදා ගැනීම සුදුසු ය.

**ඉගැන්වීමේ ක්‍රමෝපාය**

ප්‍රාථමික ශ්‍රේණිවල බුදු දහම ඉගැන්වීමේ දී කුඩා දරුවන් ප්‍රිය කරන ආගමික ජීවිතය හා සමීප ක්‍රියාකාරකම් බහුල ලෙස යොදා ගත යුතු වේ. වන්දනා, ආගමික චාරිකා, විහාර මන්දිර නැරඹීම්, වත්පිළිවෙත් මේ අතර ප්‍රධාන තැනක් ගනියි.

තව ද ජාතක කථා, චරිත කථා, ශාසන ඉතිහාසය හා සම්බන්ධ කථා රසවත් ව ඉදිරිපත් කළ යුතු ය. මේ හා සම්බන්ධ ගායනා, රංගන, චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්ය මුසු ක්‍රියාකාරකම්වල දරුවන් නිරත කරවීමට ද නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු වෙයි. එ විට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වින්දනයක් ගෙන දෙන ඉතා ම සුන්දර අත්දැකීමක් වෙමින් බුද්ධ ධර්මය ඉගෙනීමේ දැඩි ආශාවක් දරුවන් තුළ ඇති වනු නො අනුමාන ය.

**පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්**

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් බුද්ධ ධර්මය විෂයයට අදාළ බොහෝ නිපුණතා ආවරණය කර තහවුරු කළ හැකි ය. පාසල් සංස්කෘතියෙහි මෙම නිපුණතා ගොඩ නැඟෙන නව අංග ඇති කිරීම කෙරෙහි විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. මෙම වැඩසටහන පළමු වන ශ්‍රේණියේ දී ඉතා සරල ව අරඹා පස් වන ශ්‍රේණිය තෙක් ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

ගුරුවරයා විසින් තම සිසුන් වාරයකට එක් වතාවක් වත් විහාරස්ථානයට රැගෙන යා යුතු ය. එහි දී කෙරෙන වතාවත් ඇසුරින් සිසුන් තුළ ශ්‍රද්ධාව ජනිත වෙයි. මෙම ක්‍රියාකාරකම් මඟින් ගිහි-පැවිදි සම්බන්ධතාව ද වර්ධනය වේ. යහපත් සමාජයක් බිහි වීමට එය ද හේතුපාදක වනු ඇත.

පවිත්‍රතාව, විනීත බව, කරුණාව, දයාව, ආශීර්වාද ඇසුරෙන් ගොඩනැඟෙන සමානාත්මතාව, සුහදතාව, සහයෝගය ආදි ලක්ෂණවලින් පාසල් සංස්කෘතිය පෝෂණය වී ඇත. එ වැනි සංස්කෘතියක බුද්ධ ධර්මය විෂයයෙන් අපේක්ෂිත නිපුණතා වර්ධනය වන අවස්ථා සම්පාදනය කිරීම ඉතා පහසු ය. එ වැනි තත්ත්වයක් ඇති කල්හි විෂයය මඟින් ඉගෙන ගන්නා සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

**තක්සේරු කිරීම**

ප්‍රාථමික ශ්‍රේණිවල දී ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් මේ සඳහා උචිත වෙයි.

**ව්‍යාපෘති නායක**

# පටුන

**පිටුව**


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| හැඳින්වීම | vi |
| ජාතික අරමුණු | vii |
| මූලික නිපුණතා | viii - ix |
| විෂයමාලා සැලැස්ම | x |
| කාලය බෙදා ගැනීම | xi |
| බුද්ධ ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | xii - xiii |
| පටුන | xiv |
| විෂය නිර්දේශය හා ඉගෙනුම් සැලැස්ම | xv |
| ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රියාවලිය | 1 |

# විෂය නිර්දේශය

# හා

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා

# උපදෙස්

## විෂය අරමුණු

1. දරුවන් වෙතින් බෞද්ධ අනන්‍යතාව ප්‍රදර්ශනය වන චර්යා ඇති කිරීම
2. බුදු රජාණන් වහන්සේ ගේ චරිතය ඇසුරින් උන් වහන්සේ ගේ ශ්‍රේෂ්ඨත්වය හඳුන්වා දීම සහ ශ්‍රද්ධාව ජනිත කිරීම
3. නිරන්තරයෙන් තෙරුවනට ගරු කරමින් වන්දනාවට යොමු කිරීම
4. ශ්‍රී ලංකාවේ ප්‍රධාන බෞද්ධ සිද්ධස්ථානවල පූජනීය වටිනාකම් හැඳින එම ස්ථානවලට ගරු කිරීමට අවස්ථා ලබා දීම
5. බෞද්ධ සිරිත් විරිත් පිළිපදිමින් බෞද්ධ ගුණදම් වඩන පුද්ගලයන් බවට පත් කිරීම
6. ශ්‍රේෂ්ඨ බෞද්ධ චරිතාපදාන ඇසුරින් ලබා ගන්නා ආදර්ශවලට අනුකූල වූ ජීවන දර්ශනයක් ගොඩනැංවීම
7. දාන, ශීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවල යෙදවීම
8. බුදු දහමේ මූලික හරය සරල ව හඳුන්වා දීම
9. බුදු වදන් අනුගමනය කරමින් යහපත් ජීවිතයක් ගත කිරීමේ අවස්ථා උදා කර දීම
10. අන්‍යාගමික සිරිත්වලට ගරු කරමින් සහයෝගයෙන් ජීවත් වීමේ ආකල්ප රෝපණය කිරීම

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1.0 බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හැඳින ගැනීම | 1.0 බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හැඳිනගෙන චරිතායනය කරයි. | 1.1 බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය<br>• පියරජතුමාගේ දෙවන වැඳීම<br>• ශිල්ප ඉගෙනීම |
| | | 1.2 මහා කරුණා ගුණය<br>• රජ්ජුමාලා කතාව |
| 2.0 සුවිශේෂ බෞද්ධ චරිත හා ජාතක කථා හැඳින ආදර්ශයට ගැනීම | 2.0 සුවිශේෂ බෞද්ධ චරිත හා ජාතක කථා හැඳින ආදර්ශයට ගෙන කටයුතු කරයි. | 2.1 ශ්‍රේෂ්ඨ බෞද්ධ චරිත<br>• සුද්ධෝදන රජතුමා<br>• විසාඛා මහෝපාසිකාව<br>• සංඝමිත්තා තෙරණිය |
| | | 2.2 ජාතක කතා<br>• තිත්තිර ජාතකය |
| 3.0 බෞද්ධ දරුවකුගේ අනන්‍යතාව තම චර්යා මඟින් ප්‍රදර්ශනය කිරීම | 3.0 බෞද්ධ දරුවකුගේ අනන්‍යතාව තම චර්යා මඟින් ප්‍රදර්ශනය කරයි. | • දින පතා තිසරණ සහිත පන්සිල් සමාදන් වීම<br>• ආගමික කටයුතුවල දී සුදු ඇඳුමින් සැරසීම<br>• පූජ්‍ය පක්ෂය දුටු හුනස්නෙන් නැඟිටීම<br>• අන්‍යාගමික පූජකවරුන්ට ගරු කිරීම<br>• විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලාගේ ආසනවල හිඳ නොගැනීම<br>• විහාර භූමිය තුළ අල්ප ශබ්දතාව රැකීම<br>• ගුරු දෙගුරුන් නැමදීම<br>• සැදැහැ වැඩෙන සේ සාධු නාද පැවැත්වීම හා ගාථා කීම<br>• උපන් දිනයේ දී පින්කම් කිරීම |
| 4.0 ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරෙන් අපේ සංස්කෘතික උරුමය රැක ගැනීම. | 4.0 ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරෙන් අපේ සංස්කෘතික උරුමය රැක ගැනීමට දායක වෙයි. | 4.1 දානමය පින්කම<br>• බුද්ධ පූජාව<br>• බෝධි පූජාව<br>• බණ ඇසීම |
| | | 4.2 • පෙරහැර<br>• බොදු ගී ගායනය හා රස වින්දනය<br>• බෞද්ධ කලා නිර්මාණ<br>• ඖෂධ පැළයක් රෝපණය කරයි.<br>• පරිසර අලංකරණය |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| **5.0 බෞද්ධ ගුණධර්ම ඇසුරින් තමන්ටත් අනුන්ටත් හිත පිණිස වන පෞරුෂයක් ගොඩනඟා ගැනීම.** | 5.0 බෞද්ධ ගුණධර්ම ඇසුරින් තමන්ටත් අනුන්ටත් හිත පිණිස වන පෞරුෂයක් ගොඩනඟා ගනියි. | 5.1 • ලද දෙයින් සතුටු වීම<br>• යහපත් මිතුරු ඇසුර<br>• සැම විට ම සත්‍යය කතා කිරීම<br>• සුභාෂිත වචන භාවිතය<br>• පරිසරයට ආදරය කිරීම<br>• පවුලේ සාමාජිකයන් සමඟ සමගියෙන් කටයුතු කිරීම |
| **6.0 බෞද්ධ උපදේශ කාව්‍ය වනපොත් කර ගනිමින් තම ජීවිත දර්ශනය ගොඩනඟා ගැනීම.** | 6.0 බෞද්ධ උපදේශ කාව්‍ය වනපොත් කරයි. | 6.1 ගත හැකි දෙය වැඩට<br>අහක නොදමනු කිසි විට<br>වැඩ නැති දෙය නුඹ ට<br>දෙනුව ඉන් වැඩ ගන්න අය හට<br>**සිරිත් මල්දම**<br>**(ඇම්.ඇල්. සිල්වා මුහන්දිරම් ගුරු මහතා)**<br><br>බුදු ගුණ අසමින් සිත සත පායේ<br>කුරුපණ කම් ඇර පිය ඒ පායේ<br>පරපණ නැසුවොත් කවර උපායේ<br>අපමණ දුක් දෙයි සතර අපායේ<br>**ලෝවැඩ සඟරාව (වීදාගම මෛත්‍රී හිමි)** |
| **7.0 හිතකර දෛනික චර්යා රටාවක් ගොඩනඟා ගනිමින් සෞඛ්‍යවත් ජීවිතයක් ගත කිරීම.** | 7.0 හිතකර දෛනික චර්යා රටාවක් ගොඩනඟා ගනිමින් සෞඛ්‍යවත් ජීවිතයක් ගත කරයි. | 7.1 හිතකර දෛනික දිනචරියාව<br>• නියමිත වේලාවට අවදි වීම<br>• පිරිසිදු වතුර වීදුරුවක් පානය කිරීම<br>• දත් මැද මුහුණ සේදීම<br>• උදේ ආහාරය ගැනීම<br>• පාසල් යෑමට සූදානම් වී දෙමාපියන් වැඳ පිටවීම<br>• ගෙදර දොර කටයුතුවලට උදවු වීම<br>• බුද්ධ වන්දනාව<br>• පිරිසිදු වී නින්දට යෑම |
| **8.0 ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවල යෙදෙමින් දැහැමි හා සුවදායී ජීවිතයක් ගත කිරීම.** | 8.0 ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවල යෙදෙමින් දැහැමි හා සුවදායී ජීවිතයක් ගත කරයි. | 8.1 • මවුපියන් සමග සලාක දානය පූජා කිරීම<br>• මල් දන්සල් දීම<br>• මෛත්‍රී භාවනාව<br>• අටසිල් සමාදන් වීම |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| **9.0 සුවිශේෂ බුදු වදන් හදාරමින් ධම්මචාරී ජීවිතයක් ගත කිරීම.** | 9.0 සුවිශේෂ බුදු වදන් හදාරමින් ධම්මචාරී ජීවිතයක් ගත කරයි. | 9.1 • සන්තුට්ඨී පරමං ධනං<br>• නහි වේරේන වේරානි සම්මන්තීධ කුදාචනං |
| **10.0 ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධස්ථාන වන්දනා කිරීම** | 10.0 ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධස්ථාන හැඳින ඒවා සුරකිමින් හා අගයමින් වන්දනා කරයි. | 10.1 • කැලණි දාගැබ<br>• දළදා මාලිගාව |

# ඉගෙනුම් - ඉගැන්වීම් අනුක්‍රමය

| වාරය | | තේමාව | පිටු අංකය |
|---|---|---|---|
| 1 | 1 | බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හැඳින ගනිමින් චරිතායනය කිරීම | |
| | 3 | බෞද්ධ දරුවකුගේ අනන්‍යතාව ප්‍රදර්ශනය කිරීම | |
| | 7 | හිතකර දෛනික චර්යා රටාවක් ගොඩනඟා ගනිමින් සෞඛ්‍යවත් ජීවිතයක් ගත කිරීම | |
| 2 | 2 | සුවිශේෂ බෞද්ධ චරිත හා ජාතක කථා හැඳින ආදර්ශයට ගෙන කටයුතු කිරීම | |
| | 8 | ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවල යෙදෙමින් දැහැමි හා සැපවත් ජීවිතයක් ගත කිරීම | |
| | 4 | ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරෙන් අපේ සංස්කෘතික උරුමය රැක ගැනීම | |
| 3 | 6 | බෞද්ධ උපදේශ කාව්‍ය වනපොත් කර ගනිමින් ආදර්ශවත් ජීවිතයක් ගොඩනඟා ගැනීම | |
| | 5 | බෞද්ධ ගුණධර්ම ඇසුරින් තමන්ටත්, අනුන්ටත් හිත පිණිස වන පෞරුෂයක් ගොඩනඟා ගැනීම | |
| | 9 | සුවිශේෂ බුදු වදන් හදාරමින් ධම්මචාරී ජීවිතයක් ගත කිරීම | |
| | 10 | ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධස්ථාන වන්දනා කිරීම | |

# 1.0 තේමාව : බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හැඳින ගැනීම

නිපුණතාව : බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හැඳිනගෙන චරිතායනය කරයි.

## 1.1 පියරජතුමාගේ දෙවන වැඳීම හා ශිල්ප ඉගෙනීම

ඉගෙනුම් පල :
- වප් මඟුල් උලෙළේ අසිරිමත් බව විස්තර කරයි.
- සිදුහත් බෝසතාණන් පලඟක් බැඳ වැඩ හිඳ ආනාපාන සතිය වැඩූ අයුරු විස්තර කරයි.
- සුද්ධෝදන රජතුමා විසින් සිදුහත් කුමරුට වන්දනා කරන ලද දෙවන අවස්ථාව පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- සිදුහත් කුමරුට ශිල්ප කියා දුන්නේ සර්වමිත්‍ර බමුණු පඬිවරයා බව ප්‍රකාශ කරයි.
- රජ කුමරු යුද්ධ ශිල්පයෙහි දැක්වූ දක්ෂතා පිළිබඳ ව කතා කරයි.

ඉගෙනුම් සම්පත් :
- වප් මඟුල් උලෙළ සම්බන්ධ රූප රාමු
- රජ්ජුමාලා කතා පුවතේ රූප රාමු

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

පියවර 1 :
- වප් මඟුල යනු කුමක් දැයි දරුවන්ට පැහැදිලි කරන්න.
- සුද්ධෝදන රජතුමා පිරිස සමඟ සහභාගි වූ වප්මඟුල් උලෙළ ගැන කියා දෙන්න.
- වප්මඟුල් උලෙළ දා ජනතාව ප්‍රීතිඝෝෂා කරමින් ඒ සඳහා සහභාගි වූ අසිරිමත් ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 2 :
- බෝසත් සිදුහත් කුමරු එදින කිරි මවුවරුන් බාරයේ තැබූ බවත්, කිරි මවුවරුන් ඉවත් වූ පසු පිබිද ආනාපාන සති භාවනාවේ යෙදුණු බවත් රූප රාමු යොදාගෙන පැහැදිලි කරන්න.
- මෙම අසිරිමත් අවස්ථාව දැක පුදුම වූ සුද්ධෝදන රජතුමා කුමරුට නමස්කාර කළ බවත්, එය පිය රජතුමා කුමරුට වන්දනා කළ දෙවන අවස්ථාව බවත් කියා දෙන්න.

### ක්‍රියාකාරකම 2

පියවර 1 :
- සිදුහත් කුමරුගේ ශිල්ප ඉගෙනීම පහත සඳහන් කරුණු ද එකතු කර කතාන්දරයක් ආකාරයෙන් කියා දෙන්න.
  * සිදුහත් කුමරු ඉතා කීකරු රජ කුමරකු බව
  * සුදුසු කාලයේ ශිල්ප ඉගැන්වීම සඳහා බමුණු පඬිවරයකු රජ මාලිගයට ම කැඳවූ බව
  * එකල සිටි වයෝවෘද්ධ, ගුණවෘද්ධ හා සර්ව ශාස්ත්‍ර ඥානයෙන් අගතැන්පත් සර්වමිත්‍ර (විශ්වමිත්‍ර) පඬිතුමා කුමරුගේ ආචාර්යවරයා වූ බව
  * සක්විති රජ කෙනෙකුට අවශ්‍ය කඩු, දුනු ශිල්ප, චතුරංගිණී සේනාව හැසිරවීම, අක්ෂරමාලාව ආදි සියල්ල කුමරු ඉගෙන ගත් බව
  * ගුරුවරයා මවිත කරවන උගත්කමක්, මතක ශක්තියක් කුමරුට තිබූ බව
  * ඉතා ඉක්මනින් ගුරුවරයා දත් සියල්ල ඉගෙන ගත් බව

  ආදිය මතු කරන්න.

පියවර 2 :
- සිදුහත් කුමරු ශිල්ප ඉගෙන ගන්නා අවස්ථාවක් සිසුන් තේරුම් ගත් ආකාරයට චිත්‍රයට නඟන්නට අවස්ථාව දෙන්න.

**1.2 මහා කරුණා ගුණය**

- රජ්ජුමාලා කතාව

**ඉගෙනුම් පල** : • රජ්ජුමාලා, බමුණු ගෙදර දී විඳි කරදර පිළිබඳ ව සංවේදී ව කතා කරයි.
- රජ්ජුමාලාට බුදු රජුන් පිහිට වූ අවස්ථාව පිළිබඳ විස්තර කිරීමට ඉදිරිපත් වෙයි.

**ක්‍රියාකාරකම 3**

පියවර 1 : • බුදු රජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

* බුදු රජාණන් වහන්සේ ළඟ ඇත්තේ සියලු සතුන් දුකින් නිදහස් කරන කරුණාවක් බව කියා දෙන්න.

* බුදු රජාණන් වහන්සේ ගේ කරුණාව මහා කරුණාවක් වූයේ දෙවියන්, බඹුන්, මිනිසුන් හා සියලු සතුන් වෙත නිරන්තරයෙන් පිහිට වීම සඳහා කාරුණික වූ නිසා බව කියා දෙන්න.

* සියලු සත්ත්වයා සසර දුකින් එතෙර කරන නිසා බුදු රජාණන් වහන්සේ මහා කාරුණික වූ බව කියා දෙන්න.

* බුදුන් වහන්සේ සැම දිනක ම අලුයම පිබිද ලොව දෙස බලා පිහිට විය යුතු අය සොයා ගිය බව කියා දෙන්න.

පියවර 2 : • බුදු රජාණන් වහන්සේ මහා කරුණාවෙන් කටයුතු කළ අවස්ථා කිහිපයක් පෙර දැනුම මතකයට නංවමින් කියා දෙන්න.
*උදා* : සෝපාක, මට්ටකුණ්ඩලී, ගැරඬියකු පෙලූ ළමයින්ගේ කතාව

**ක්‍රියාකාරකම 4**

පියවර 1 : • රජ්ජුමාලා කතාව සිසුන්ට සංවේදී බව මතු වන සේ ගොඩනගන්න.
- කතාව ගොඩනැඟීමේ දී සිසුන් සහභාගි කර ගන්න. අවශ්‍ය පරිදි රූප රාමු වැනි ආධාරක යොදා ගන්න.

**තක්සේරුව** : • සිදුහත් කුමරුට පිය රජතුමා විසින් වඩින ලද දෙවන අවස්ථාව වාචික ව ප්‍රකාශ කරයි.
- සිදුහත් කුමරු උගත් ශිල්ප ලියා දක්වයි.

**ප්‍රායෝගික ජීවිතය සඳහා**

- ගුරුවරුන්ගේ සහ වැඩිහිටියන්ගේ උපදෙස් පිළිපදිමින් යහපත් සියලු දේ ඉගෙන ගැනීම
- අසරණ වූ අයට හැකි සැම අවස්ථාවක ම කාරුණික ව උදවු උපකාර කිරීම

## 2.0 තේමාව : සුවිශේෂ බෞද්ධ චරිත හා ජාතක කථා ආදර්ශයට ගැනීම

**නිපුණතාව** : සුවිශේෂ බෞද්ධ චරිත හා ජාතක කථා හැඳින ආදර්ශයට ගෙන කටයුතු කරයි.

### 2.1 සුවිශේෂ බෞද්ධ චරිත

**ඉගෙනුම් පල** :

- සුද්ධෝදන රජතුමා තුළ පැවති උසස් ගුණාංග ප්‍රකාශ කරයි.
- විසාඛා සිටු දේවිය තුළ පැවති ශ්‍රද්ධාවන්ත ගුණාංග ප්‍රකාශ කරයි.
- මිසදිටු මිගාර සිටුතුමා සුමඟට ගැනීමට විශාඛාව කටයුතු කළ ආකාරය පිළිබඳ විස්තර කරයි.
- සංඝමිත්තා තෙරණිය ජය ශ්‍රී මහා බෝධිය රැගෙන ලංකාවට පැමිණි අසිරිමත් අවස්ථාව විස්තර කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- විසාඛා මහෝපාසිකාවගේ රූප රාමුවක්
- ජය ශ්‍රී මහා බෝධිය ලංකාවට වැඩමවීම සම්බන්ධ රූපරාමුවක්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 1

**සුද්ධෝදන රජතුමා**

පියවර 1 : • සුද්ධෝදන රජතුමා යනු කවරෙක් ද යි පහත සඳහන් කරුණු ද ඇතුළත් වන සේ දරුවන් ද සම්බන්ධ කර ගනිමින් සාකච්ඡාවක නිරත කරවන්න.

* සුද්ධෝදන රජතුමා සිදුහත් කුමරුන්ගේ පියාණන් බව
* කිඹුල්වත් පුර අගරජු බව
* රජතුමාගේ බිසව මහාමායා දේවිය බව
* ශාක්‍ය වාංශිකයකු බව

පියවර 2 : • සුද්ධෝදන රජතුමාගේ පහත සඳහන් ගුණාංග මතු වන සේ සාකච්ඡාවක නිරත වන්න.

* වීර බවින් අන් හැමට ම වඩා විශිෂ්ට වීම.
* රූප සම්පත්තියෙන් ද විශිෂ්ට වීම.
* යුද්ධ ශිල්පවලින් ප්‍රවීණ වීම.
* අන් අයට හොඳින් සවන් දීම
* ධාර්මික වීම

පියවර 3 : • පියකු ලෙස සුද්ධෝදන රජතුමා තුළ පැවති උසස් ගුණාංග පහත සඳහන් කරුණු ඇසුරින් සාකච්ඡා කරන්න.

* බෝසත් සිදුහත් කුමරු ඉපදුණු බව දැනගත් රජතුමා සතුටු වූ බව
* මහාමායා දේවිය කලුරිය කළ පසු ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු කිරි අම්මාවරුන් මඟින් රැකබලා ගැනීම හා සෙනෙහස ලබා දුන් බව
* සුදුසු කාලයේ දී ශිල්ප ලබා දුන් බව
* රම්‍ය, සුරම්‍ය, සුභ මාලිගා සාදා දී සැපවත් ජීවිතයක් ගත කිරීමට ඉඩ ලබා දුන් බව

පියවර 4 : • සුද්ධෝදන රජතුමා පිළිබඳ ව තමා උගත් දේ වැකි කිහිපයකින් ලියා දැක්වීමට සිසුන් යොමු කරන්න.

### ක්‍රියාකාරකම 2

**විශාඛා මහෝපාසිකාව**

පියවර 1 : • විසාඛා සිටුදේවිය පිළිබඳ ව පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක නිරත වන්න.

* හද්දිය නුවර ධනංජය සිටුතුමාගේ දියණියන් බව
* ඇය ඉතා රූමත්, ගුණවත්, උගත් කාන්තාවක බව
* කුඩා කාලයේ සිට ම මව හා පියා සමඟ පන්සල් යාමට පුරුදු වී සිටි බව
* ඒ නිසා ම බුදු රජාණන් වහන්සේගෙන් බණ අසා අවුරුදු හතේ දී සෝවාන් වූ බව
* බුදු රජාණන් වහන්සේ ඇතුළු මහා සංඝරත්නයට සැදැහැ සිතින් දන් දුන් බව
* විවාහ වූයේ මිසදිටු පවුලකින් බව
* ඒ සැවැත් නුවර මිගාර සිටුවරයාගේ පුත් පූර්ණවර්ධන සමඟ බව
* එම පවුලේ අය බුදුදහම පිළිබඳ වැරදි අවබෝධයකින් සිටි බව
* විසාඛාව මිගාර පවුලේ සැමදෙනා ම සුමඟට ගත් බව
* එබැවින් ඇය මිගාර මාතා නම් වූ බව
* ඇයට බුදු සසුනේ අග්‍ර දායිකා තනතුර ලැබුණු බව

පියවර 2 : • ධනංජය සිටුතුමා තම දියණියන්ට රන්, රිදී, මුතු, මැණික් ඔබ්බවා කරන ලද වටිනා පලඳනාවක් තනවා දුන් බව හා එය 'මේල පලඳනාව' ලෙස හැඳින්වූ බව

• පියාගෙන් ලැබුණු ඉතා වටිනා මේල පළඳනාව හා සමාන ධනයක් වියදම් කොට පූර්වාරාමය කළ බව. (කහවණු 27 කෝටියක්)

• එය 'මිගාර මාතු පාසාදය' නමින් හැඳින්වූ බව

• පූර්වාරාමය අංග සම්පූර්ණ දෙමහල් ආරාමයක් බව

• මාස 09න් වැඩ නිම කර බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට දන් පිරිනමා පූජා කළ බව

• බුදු රජාණන් වහන්සේ අවුරුදු 6ක් පූර්වාරාමයේ වස් විසූ බව

• විසාඛාව දින පතා පූර්වාරාමයට ගොස් ස්වාමීන් වහන්සේලාගේ සුවදුක් සොයා බැලූ බව

• කුඩා සාමණේරවරුන් තම මව එන්නේ යැයි විසාඛාව එන තෙක් බලා සිටීම.

පියවර 3 : • විශාකා මහෝපාසිකාව පිළිබඳ ව වගන්ති කිහිපයක් ලිවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

### ක්‍රියාකාරකම 3

**සංඝමිත්තා තෙරණිය**

පියවර 1 : • විශාල ලෙස සකසා ගත් සංඝමිත්තා රහත් මෙහෙණිය විසින් ජය ශ්‍රී මහා බෝධි ශාඛාව ලක්දිවට වැඩම කරවීමේ පින්තූරය ප්‍රදර්ශනය කරන්න.

• එම පින්තූරය පිළිබඳ ව දරුවන් දන්නා දේවල් විමසන්න.

• සැම දරුවකුට ම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

• දරුවන්ගේ අදහස් ද මතු කරමින් සංඝමිත්තා තෙරණිය බුදු රජාණන් වහන්සේ පිට දුන් ජය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩම කරවා දෙවන පැතිස් රජතුමාගේ මූලිකත්වයෙන් අනුරාධපුර මහමෙවුනා උයනේ රෝපිත කළ බව සාකච්ඡා කරන්න.

• උඳුවප් පොහෝ දින සංඝමිත්තා පෙරහැර පවත්වන බව කියා දෙන්න.

පියවර 2 : • ජය ශ්‍රී මහා බෝධිය රැගෙන පැමිණි සංඝමිත්තා මහ තෙරණිය ලක්දිව දඹකොළ පටුනට ගොඩබට, දෙවන පැතිස් රජු කරවටක් මුහුදට බැස ශ්‍රද්ධාවෙන් එය පිළිගෙන පුද පෙරහැරින් අනුරපුරයට වැඩම කරවූ බවත් කියා දෙන්න.

පියවර 3 : • සංඝමිත්තා තෙරණිය විසින් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක්දිවට වැඩමවූ අවස්ථාව චිත්‍රයට නඟන්නට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

## 2.2 ජාතක කථා - තිත්තිර ජාතකය

**ඉගෙනුම් පල** :

- ජාතක කතාව කතන්දරයක් ලෙස මතකයෙන් කියයි.
- වැඩිහිටියන්ට සැලකීම වටිනා ගුණාංගයක් බව පිළිගනිමින් කතා කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- තිත්තිර ජාතක කථාවට අදාළ ව රූපරාමු
- $A_4$ කඩදාසි
- පාට පෙට්ටි

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම 4

පියවර 1 :
- වැඩිහිටියෝ යනු කවුරු දැයි යන ප්‍රශ්නය සිසුන්ට ඉදිරිපත් කර සිසුන්ගෙන් පිළිතුරු ලබා ගනිමින් වැඩිහිටියන් පිළිබඳ ව හඳුන්වා දෙන්න.
- වැඩිහිටියන්ට සැලකිය යුත්තේ ඇයි දැයි විමසන්න. සිසුන්ගෙන් ලැබෙන පිළිතුරු ඇසුරින් වැඩිහිටියන්ට සැලකිය යුතු ආකාරය හා ගරු බුහුමන් දැක්විය යුතු ආකාරය පිළිබඳ ව සිසුන්ට පහදා දෙන්න.

පියවර 2 :
- මිනිසුන් අතර පමණක් නොව සතුන් අතර ද වැඩිහිටියන්ට ගරු කිරීමේ ගුණය පැවති බව තිත්තිර ජාතක කථාව ඇසුරින් පැහැදිලි කරන්න.

### ක්‍රියාකාරකම 5

පියවර 1 :
- තිත්තිර ජාතක කථාවට අදාළ රූප රාමු කිහිපයක් සකසා ගන්න.
- රූප රාමු එකින් එක පුවරුවක් මත ප්‍රදර්ශනය කරමින් තිත්තිර ජාතක කථාව සිත් ගන්නා ලෙස දරුවන්ට කියා දෙන්න.
- ඒ සඳහා පහත කරුණු ද ඇතුළත් කර ගන්න.
  - * හිමාලය වනයෙහි මැද මහා නුග ගසක් පිහිටි බව
  - * මේ නුග ගස යට සැම දින ම හමු වන ඇතකු, වඳුරකු හා වටු කුරුල්ලකු මිතුරු ව විසූ බව
  - * දිනක් වැඩිහිටියන් හට ගරු කළ යුතු බව සිතූ ඔවුන් තමන් අතරින් වැඩිහිටියා කවරෙක් දැ යි සෙවූ බව
  - * මහා නුග ගස පළමු ව දුටු කෙනා වැඩිහිටියා බවට යෝජනා කරගත් බව
  - * ඒ අනුව එකිනෙකා තම තමන් නුග ගස පිළිබඳ ව දන්නා දේ ප්‍රකාශ කළ බව
  - * කැලේ ඇවිදින විට නුග ගස බඩේ ගෑවුණු අයුරු ඇතා කී බව
  - * තමන් බිම හිටගෙන නුග ගසේ දළු කෑ බව වඳුරා පැවසූ බව
  - * වෙන නුග ගසකින් ඇටයක් කා මල පහ කළාට පසු මේ නුග ගස පැළ වූ බව වටු කුරුල්ලා කී බව
  - * ඒ අනුව වැඩිහිටියා තෝරා වැඩිහිටි වටු කුරුල්ලාට එදා සිට ගරු බුහුමන් දැක්වූ බව
- බාහිර ස්වරූපයෙන් කුඩා වුවත් වැඩිහිටියන් හඳුනාගෙන ඔවුන්ට ගරු බුහුමන් දැක්වීම උතුම් ගුණාංගයක් බව කතාවේ සිද්ධි ඉස්මතු කරමින් සිසුන්ට කියා දෙන්න.
- විරිදු ගායනාවක් යොදා ගනිමින් සිත් ගන්නා ලෙස කතාන්දරය ගොඩනගන්නට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- ගුරුතුමිය කී කතාව පින්තූර ඇසුරින් ගොඩනගන්නට පන්තියේ සිසුන් කිහිප දෙනෙකුට ද අවස්ථාව ලබා දෙන්න.
- අනතුරුව තිත්තිර ජාතක කතාව මතකයෙන් කියන්නට හෝ නාට්‍යානුසාරයෙන් රඟ දැක්වීමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 6**

පියවර 1 :
- ජාතක කථාවේ සිද්ධි කිහිපයක් තෝරා ගන්න.
- ඒ අනුව සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට සුදු $A_3$ කොළ හා පැස්ටල් පාට පැන්සල් ලබා දෙන්න.
- අදාළ කොටස් චිත්‍රයට නඟන්නට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

පියවර 4 :
- සිසුන් චිත්‍ර ඇඳීමේ නිරත කරවන්න.
- සිසු කණ්ඩායම් ඇඳි චිත්‍ර, කතාවේ අනුපිළිවෙළට බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරන්නට සිසුන් යොමු කරන්න.
- පින්තූර රාමු විස්තර කරමින් කතාව ගොඩනගා කියන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සියලු ම දෙනා ඇගයීමට ලක් කරන්න.

**තක්සේරුව :**
- සුද්ධෝදන රජතුමා පිළිබඳ ව වැකි දෙකක් ලියයි.
- බුදු සසුනේ අග්‍ර දායිකා තනතුර ලැබුණේ කාහට දැයි ප්‍රකාශ කරයි.
- උඳුවප් පොහෝ දිනයේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- තිත්තිර ජාතක කතාව පින්තූර ඇසුරින් ගොඩනගා පවසයි.

**ප්‍රායෝගික ජීවිතය සඳහා**

- පුරුද්දක් ලෙස සැම අවස්ථාවක ම පවුලේ අය සමඟ පන්සල් යාම
- වැඩිහිටියන් හඳුනාගෙන ගරු බුහුමන් දැක්වීම.

## 3.0 තේමාව : බෞද්ධ දරුවකුගේ අනන්‍යතාව ප්‍රදර්ශනය කිරීම

**නිපුණතාව** : බෞද්ධ දරුවකුගේ අනන්‍යතාව තම චර්යාව මඟින් ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් පල** :
- නිවැරදි ඉරියවු අනුගමනය කරමින් තිසරණ සහිත පන්සිල් සමාදන් වෙයි.
- ආගමික කටයුතුවල දී නිවැරදි චර්යා අනුගමනය කරයි.
- විහාරස්ථානයේ දී නිවැරදි වත් පිළිවෙත් අනුගමනය කරයි.
- උපන් දිනය දා පුණ්‍ය ක්‍රියාවක යෙදෙයි.

**ඉගෙනුම් සම්පත්** :
- පන්සල් යාමට අවශ්‍ය ද්‍රව්‍ය
- උපන් දින පින්කම සඳහා අවශ්‍ය දේවල්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**අපි බොදු දරුවෝ වෙමු.**

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :
- පෙර උගත් කරුණු ද සිහිපත් කරමින් තිසරණ සහිත පන්සිල් සමාදන් වීමේ නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරන්නට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2 :
- දරුවන් විහාරස්ථානයකට කැඳවාගෙන යන්න.
- විහාරස්ථානයට පිවිසීමේ දී අනුගමනය කළ යුතු වත්පිළිවෙත් හා විහාරභූමිය තුළ හැසිරිය යුතු ආකාරය දරුවන් සමඟ කතාබහ කරන්න.

**ක්‍රියාකාරකම 2**

- දෙමාපිය සහභාගිත්වය ඇතිව විහාරස්ථානයට යාමේ වැඩසටහනක් සංවිධානය කරගන්න.
- එහිදී,
  - * මළු පෙත් මං ඇමදීම
  - * විහාර භූමිය තුළ අල්ප ශබ්දතාව රැකීම
  - * ශාසනික වචන භාවිතය
  - * නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරමින් ආගමික කටයුතුවල යෙදීම

  ආදිය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් කායික හා වාචසික සංවරය පවත්වා ගනිමින් විහාරස්ථානයේ දී හැසිරිය යුතු බව තහවුරු කරන්න.

**ක්‍රියාකාරකම 3**

- නියමිත ඉරියව්වේ පිහිටා සැදැහැ වැඩෙන සේ සාධු නාද පවත්වමින් ගාථා සජ්ඣායනය කිරීමට සිසුන් යොමු කරන්න.

**උපන් දිනය දා පින්කම් කිරීම**

**ක්‍රියාකාරකම 4**

පියවර 1 : • උපන් දිනය සිහිපත් කරමින් සිදුකරන කටයුතු මොනවාදැයි සිසුන්ගෙන් විමසමින් සාකච්ඡාවක නිරත වන්න.

පියවර 2 : • ඒ ඇසුරින් උපන්දිනය දා කළ හැකි පින්කම් කිහිපයක් හඳුන්වා දෙන්න.

* පන්සලට ගොස් වන්දනා කිරීම

* දාන පින්කමක් පැවැත්වීම

* වැඩිහිටි නිවාසයකට ආහාර ද්‍රව්‍ය සැපයීම

* රෝහලකට බෙහෙත් ද්‍රව්‍ය ලබා දීම

* අවශ්‍යතා ඇති කෙනෙකුට ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම

පියවර 3 : • උපන්දින උත්සව පැවැත්වීම සඳහා යොදවන මුදල් ප්‍රයෝජනවත් වන දෙයක් සඳහා යෙදවීමට පුරුදු වීමේ වැදගත්කම වටහා දෙන්න.

පියවර 4 : • දෙමාපිය සහභාගිත්වය ඇති ව පන්තියේ සිසුවකුගේ/සිසුවියකගේ උපන්දිනයක් සඳහා කළ හැකි පින්කමක් සංවිධානය කරන්න.

**තක්සේරුව** : • නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරමින් බුද්ධ වන්දනාවේ යෙදෙයි.
• උපන්දිනය දා කළ හැකි පින්කම් කිහිපයක් නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතය සඳහා**

- දිනපතා බුද්ධ වන්දනාවේ යෙදීම.
- තමාගේ උපන්දිනය දා ප්‍රයෝජනවත් දෙයකට මුදල් යෙදවීමට පුරුද්දක් ඇති කර ගැනීම.

## 4.0 තේමාව : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරෙන් අපේ සංස්කෘතික උරුමය රැක ගැනීම

**නිපුණතාව** : ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරෙන් අපේ සංස්කෘතික උරුමය රැක ගැනීමට දායක වෙයි.

**ඉගෙනුම් පල** : 4.1

- සැදැහැයෙන් යුක්ත ව සංවිධානය වී බෝධි පූජා පින්කමක් සිදු කරයි.
- සංවර ව අවධානයෙන් යුක්ත ව ධර්ම ශ්‍රවණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ධර්ම ශ්‍රවණය පවත්වන ස්ථානය සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය
- බණ අසන ආකාරය දක්වෙන පින්තූරයක්
- බෝධි පූජාවක දී භාවිත කරන ද්‍රව්‍ය පිළිබඳ ලැයිස්තුවක්
- බෝධි පූජා පැවැත්වෙන ස්ථානය, පැදකුණු කරන ආකාරය, බෝධි පූජාව පැවැත්වෙන අවස්ථා සහිත රූප රාමු

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### 4.1 බෝධි පූජාව

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :

- බෝධි පූජා පින්කම් සඳහා සිසුන් සහභාගි වී ඇති අවස්ථා පිළිබඳ ව විමසන්න.
- පූජා ද්‍රව්‍ය පූජා කරමින් ශ්‍රද්ධාව වර්ධනය කර ගැනීම සඳහා බෝධි පූජා පවත්වන බව සිසුන්ට කියා දෙන්න.
- බෝධි පූජා පැවැත්වීම සඳහා අරමුණු කරගන්නා කරුණු කිහිපයක් දරුවන් සමඟ සාකච්ඡා කරන්න.

*උදා :* * බුදුර ජාණන් වහන්සේ වෙනුවෙන් පූජා පවත්වා පින් රැස් කර ගැනීම
 * නීරෝග ජීවිතයක් ලබා ගැනීම සඳහා ආශීර්වාද ලබා ගැනීම
 * ජීවිතයේ විවිධ අවස්ථා සඳහා ආශීර්වාද ලබා ගැනීම

පියවර 2 :

- බෝධි පූජා පින්කමක් සංවිධානය කරගන්න.
- බෝධි පූජාව සඳහා අවශ්‍ය පූජා ද්‍රව්‍ය සපයා ගන්න.
- බෝමළුව ඇමදීම, මල් ආසන සෝදා පිරිසිදු කිරීම ආදි වත්පිළිවෙත්වල සිසුන් නිරත කරවන්න.
- පූජා ද්‍රව්‍ය පූජාවට සුදුසු ලෙස සකස් කර ගන්න.
- බුද්ධ පූජාව ත්‍රිවිධ බෝධීන් සඳහා තැන්පත් කරන්න.
- ස්වාමීන් වහන්සේ නමක් වැඩම කොට ගෙන බෝධි පූජා පින්කම පවත්වන්න.
- පින්කම අවසානයේ පූජා කරන ලද ද්‍රව්‍ය (මල්, ගිලන්පස ආදිය) ඉවත් කර එම ස්ථාන පිරිසිදු කිරීමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2**

පියවර 1 : • බණ ඇසීමේ වැදගත්කම පිළිබඳ පහත කරුණු භාවිත කරමින් සාකච්ඡාවක නිරත කරවන්න.

* සිත සන්සුන් වන බව
* ධර්ම කරුණු දැනගැනීමට හැකි බව
* බාහිර ඉන්ද්‍රියයන් පාලනය කරගත හැකි බව
* මෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට පින් පුරවා ගැනීමට හැකිවන බව
* හොඳ ළමයකු ලෙසින් සමාජයේ කටයුතු කිරීමට හැකිවන බව
* දෙමාපිය වැඩිහිටියන්ට, ගහකොළ සතා සිවුපාවා ආදි සියලු දෙනාට ප්‍රියමනාප වන බව

පියවර 2 : • ධර්ම දේශනයක් පවත්වන ස්ථානය සකස් කර ගන්නා ආකාරය හා ධර්ම දේශනයක දී සිදුකරන වත් පිළිවෙත් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

* ස්ථානය පිරිසිදු කර ගැනීම
* සුදුසු ලෙස පරිසරය සකස් කර ගැනීම
* බාහිර පරිසරය ශ්‍රද්ධාව වැඩෙන පරිදි සකසා ගැනීම
* අසුන් පැනවීම
* දැහැත් වට්ටි, මල් පහන්, පිරිකර සූදානම් කර ගැනීම
* පා ධෝවනයට අවශ්‍ය දේ
* ධර්ම දේශනාවේ දී දහම් ශ්‍රවණය කළ යුතු ආකාරය (අවශ්‍ය ඉගෙනුම් සම්පත් භාවිත කරමින්)

**ක්‍රියාකාරකම 3**

පියවර 1 : • පෙර දිනයේ සාකච්ඡා කළ පරිදි වත් පිළිවෙත් අනුගමනය කරමින් ස්වාමීන් වහන්සේ මූලික පැනවූ ආසන මත වඩා හිඳුවන්න.

පියවර 3 : • බණ ඇසීමේ (ධර්ම දේශනයට සවන් දීමේ) අවස්ථාවට සියලු ම සිසුන් සහභාගි කරවා ගන්න.

• ස්වාමීන් වහන්සේට දැහැත් වට්ටිය පිළිගන්වා ධර්ම දේශනාවට ආරාධනා කරන්න.
• සූදානම් කරගත් පූජා ද්‍රව්‍ය දරුවන් ලවා පූජා කරවන්න.
• ස්වාමීන් වහන්සේට වන්දනා කර ආශීර්වාද ලබා ගැනීමට යොමු කරන්න.

**ක්‍රියාකාරකම 4**

පියවර : • පෙර දින ධර්ම දේශනයේ දී උගත් ධර්ම කරුණු මතකයට නංවන්න.

• ලබාගත් ආදර්ශ පිළිබඳ ව කතාබහ කරන්න.
• ඒවා ශිෂ්‍ය ජීවිතයට ඇතුළත් කරගත හැකි ආකාරය දරුවන්ට කියා දෙන්න.
• ධර්ම දේශනය ඇසුරින් උගත් ධර්ම කරුණු තුනක් අභ්‍යාස පොතේ ලිවීමට සිසුන් යොමු කරන්න.

## 4.2 පොත් පෙරහැර

**ඉගෙනුම් පල** : • පොත් පෙරහැර සංවිධානය කරයි.

• බොදු ගී ගායනා කරමින් වින්දනයක් ලබයි.
• සාමූහිකව එකතු වී ඖෂධ පැළයක් රෝපණය කරයි.
• ශ්‍රමදානයකට සහභාගි වෙමින් පරිසරය පිරිසිදු කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**පොත් පෙරහැර**

**ක්‍රියාකාරකම 1**

- 'පෙරහැර' යනු කුමක් දැයි සරල ව සිසුන්ට පැහැදිලි කරන්න. ඒ සඳහා පහත කරුණු ද එක් කර ගන්න.
  - * දළදා පෙරහැර, පොසොන්/මිහිඳු පෙරහැර, මල් පෙරහැර ආදි වශයෙන් පෙරහැර පවත්වන බව
  - * පොත් හිස මත තබාගෙන පෙළියට ගමන් කිරීම පොත් පෙරහැර වශයෙන් හඳුන්වන බව
  - * ඒවා පුස්තකාලයයක තැන්පත් කරන බව
  - * එම පොත් අන් අයට ද පරිහරණය කිරීමට අවස්ථාව ලැබෙන බැවින් එය පින් සිදු වන කටයුත්තක් බව

පියවර 2 :
- සුදුසු ආකාරයකට පොත් පෙරහැරක් සංවිධානය කර ගන්න.
- එම පොත් ගෞරවයෙන් යුක්ත ව පුස්තකාලයයේ තැන්පත් කිරීමට සිසුන් යොමු කරන්න.

**බොදු ගී**

**ක්‍රියාකාරකම 2**

පියවර 1 :
- බොදු ගී යනු මොනවා දැයි සරල ව සුහද කතාබහක යෙදෙන්න.
  - * බුදු රජාණන් වහන්සේගේ ගුණ ගැයෙන බව
  - * සංයමයකින් යුතු ව ගායනා කරන බව
  - * බුදු රජාණන් වහන්සේ පිදිය හැකි බව

පියවර 2 :
- ළමා මනසට ගෝචර කරගත හැකි බොදු ගී ඇසෙන්නට සලස්වන්න.
- අදාළ බොදු ගීයෙන් මතුවන බුදු ගුණ සරල ව කියා දෙන්න.
  - * මල් සුගන්දේ . . .
  - * සිරිමා බෝ මුල . . .
  - * මලක් නෙළා ගෙනවිත්
  - * බුදු සාදූ බුදු සාදූ - සඳුන් ගසක් වෙන්නම් . . . වැනි ගීත

පියවර 3 :
- පෙර උගත් බොදු ගී කණ්ඩායම් වශයෙන් ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දෙමාපිය සහයෝගය ඇති ව බොදු ගී සරණියක් සංවිධානය කර ක්‍රියාත්මක කරන්න.

**බෞද්ධ කලා නිර්මාණ**

**ක්‍රියාකාරකම 3**

පියවර 1 :
- පහත කරුණු ද ඇතුළත් කර ගනිමින් බෞද්ධ කලා නිර්මාණ පිළිබඳ ඉතා සරල ව සාකච්ඡා කරන්න.
  - * බුදු පුද සඳහා නිර්මාණය කළ බව
  - * ජීවමාන බුදුන් වහන්සේ ලෙස සිතා වන්දනා කරන බව
  - * අපේ රටේ සිටි පැරැන්නන්ගේ කලා කුසලතා පිළිබඳ ව

පියවර 2 :
- බෞද්ධ කලා නිර්මාණ සකස් කිරීමට සිසුන් යොමු කරන්න.
  - * වෙසක් පත් නිර්මාණය
  - * ආකෘති නිර්මාණය
    - වෙහෙර වහන්සේ
    - බුදු ගෙය
    - පෙරහැරක අංග
    - තොරණ . . . ආදි
- සකස් කරන ලද නිර්මාණ ප්‍රදර්ශනය කර ඇගයීමට ලක් කරන්න.

**ඖෂධ පැළයක් රෝපණය**

**ක්‍රියාකාරකම 4**

පියවර 1 :
- ඖෂධ පැළෑටිවල ඇති වැදගත්කම ගැන සිසුන් දැනුම්වත් කරන්න.
- හැකි නම් ඔසු උයනක් ඇති ස්ථානයකට සිසුන් කැඳවාගෙන ගොස් හෝ පරිසරය නිරීක්ෂණය කර හෝ ඔසු පැළ ගැන අවබෝධය ලබා දෙන්න.

පියවර 2 :
- හඳුනා ගත් ඔසු පැළවල නම් අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට අවස්ථාව දෙන්න.
- ඔසු පැළෑටි වගා කිරීම නිසා ඒවායේ ප්‍රයෝජන අනාගත පරපුරට ලබා ගැනීමට හැකිවීම පින් සිදුවන ක්‍රියාවක් බව පැහැදිලි කරන්න.
- ඔසු පැළ වගා කිරීම නිසා පරිසරය අවට සුවදායක ස්ථානයක් බවට පත් කර ගත හැකි බව සිසුන්ට අවබෝධ කර දෙන්න.

පියවර 3 :
- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර ඔසු පැළ සිටුවීමට අවස්ථාවක් ලබා දෙන්න.
- සෑම කණ්ඩායමකට ම වගා කිරීමට ඔසු පැළයක් බැගින් සපයා දෙන්න.
- කණ්ඩායම් වශයෙන් පැළ වගාකර ඒවා රැකබලා ගනිමින් පොහොර හා ජලය අවශ්‍ය පරිදි ලබා දීම, නඩත්තු කිරීම ආදි කටයුතු සඳහා සිසුන් යොමු කරන්න.

**ශ්‍රමදාන පිංකම**

**ක්‍රියාකාරකම 5**

පියවර 1 :
- වෙසක් පොහොය හා සමගාමී ව ශීල භාවනා දිනයක් නම් කර ගන්න.
- පාසලට කිට්ටු ම විහාරස්ථානය වෙත ගොස් ස්වාමීන් වහන්සේ මුණගැසී ශීල භාවනා වැඩසටහනට සුදුසු දිනයක් වෙන් කර ගන්න.
- ශීල භාවනා වැඩසටහනට පෙර දින පන්සල හා අවට පරිසරය පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් පැවැත්වීමට ස්වාමීන් වහන්සේගෙන් අවසර ලබා ගන්න.

පියවර 2 :
- දෙමාපිය හමුවක් පවත්වා ශ්‍රමදානය පැවැත්විය යුතු ආකාරය පිළිබඳ ව දැනුම්වත් කරන්න.
- දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් හැකි සෑම කටයුත්තක් සඳහා ම සිසුන් ශ්‍රමදානයට එක් කර ගන්න.
- පන්සල් භූමියේ දී හැසිරිය යුතු ආකාරය පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න.
- ශ්‍රමදාන පින්කම තම ශ්‍රමය දන්දීමේ වැදගත් පිංකමක් බව පැහැදිලි කරන්න.

පියවර 3 :
- ශ්‍රමදානය අවසන් වීමෙන් අනතුරුව, අප එක් වී යමක් කිරීමේ අගය පිළිබඳවත්, ඉන් සමඟිය හා එකමුතුකම වර්ධනය වන බවත් කියා දෙන්න.
- ශ්‍රමදානය නිසා පන්සල් වත්ත අලංකාර වී ඇති බවත්, ඒ නිසා අපේ සිත් සතුටින් පිරී ඇති බවත් සිසුන් සම්බන්ධ කර ගනිමින් සාකච්ඡා කරන්න.
- ශ්‍රමදානයේ දී ලබා ගත් අත්දැකීම් පිළිබඳ ව කෙටි සමාලෝචනයක යෙදෙන්න.

**තක්සේරුව :**
- පහසුවෙන් නිර්මාණය කළ හැකි බෞද්ධ කලා නිර්මාණයක් සකසයි.
- සාමූහික ව එකතු වී ඔසු පැළ නඩත්තු කරයි.

**ප්‍රායෝගික ජීවිතය සඳහා**

- පුස්තකාලයයකට පොත්පත් පරිත්‍යාග කිරීම
- පරිසරය පිරිසිදු කිරීමේ ශ්‍රමදානයකට සහභාගි වීම
- නිවසේත් ඔසු පැළ රෝපණය කිරීම
- කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීමේ පුරුද්ද ඇති කර ගැනීම

## 5.0 තේමාව : බෞද්ධ ගුණධර්ම ඇසුරින් තමන්ටත් අනුන්ටත් හිත පිණිස වන පෞරුෂයක් ගොඩනගා ගැනීම

**පුංචි අපේ දන්සල**

**නිපුණතාව** : **බෞද්ධ ගුණධර්ම ඇසුරින් තමන්ටත් අනුන්ටත් හිත පිණිස වන පෞරුෂයක් ගොඩනගා ගනියි.**

**ඉගෙනුම් පල** :
- තමන් සතු වූ දෙයින් සෑහීමකට පත්විය යුතු බව අවධාරණය කරමින් කතා කරයි.
- කල්‍යාණ මිත්‍ර ඇසුර පුරුදු කරයි.
- සෑම විට ම සත්‍ය වචන ප්‍රකාශ කරයි.
- තමා දන්නා සුභාෂිත වචන ලියා පන්තියේ ප්‍රදර්ශනය කරයි.
- පරිසරය පිරිසිදුව තබා ගැනීමට දායක වෙයි.
- පවුලේ සමගිය රැක ගැනීමේ වැදගත්කම පිළිගනිමින් කතා කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- බ්‍රිස්ටල් බෝඩ්,
- ඩිමයි කොළ
- ප්ලැටිග්නම්
- සෙලෝටේප්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :
- ලද දෙයින් සතුටුවීම යනු කුමක්දැයි සිසුන්ට පැහැදිලි කර දෙන්න.
  - * ලද දෙයින් සතුටු වීමේ ගුණය 'සන්තුට්ඨී' නමින් කරණීය මෙත්ත සූත්‍රයේ දැක්වෙන බව
  - * තම ශක්ති ප්‍රමාණයේ හැටියට, ගත් උත්සාහයේ තරමට, ලබා ඇති සුදුසුකම් අනුව තමන්ට ලැබෙන දෙය ප්‍රමාණවත් යැයි සතුටු වන්නේ 'සන්තුට්ඨී ගුණය' ඇති අය බව
- ලද දෙයින් සතුටු විය හැකි ආකාරය පිළිබඳ ව පහත කරුණු ඔස්සේ දරුවන් සමඟ සරල සාකච්ඡාවක යෙදෙන්න.
  - * තමාට ලැබී ඇති දේ පිළිබඳ ව සතුටු විය යුතු බව
  - * දෙමාපියන්ට හැකි පමණින් අපට හැම දේම ලබා දෙන බව
  - * ඒ සියල්ල සතුටින් බාර ගැනීමට හැකි විය යුතු බව
  - * තමන්ට කැමති කැමති දේවල් ඉල්ලා දෙමාපියන්ට කරදර නොකළ යුතු බව

පියවර 2 :
- ලද දෙය ප්‍රයෝජනවත් ව භාවිත නොකිරීම නිසා සම්පත් නාස්ති වන ආකාරය පහත කරුණු ද මතු කරමින් කියා දෙන්න.
  - * අනවශ්‍ය ලෙස නිවෙස්වල, මහා මාර්ගවල විදුලි පහන් මොන තරම් ප්‍රමාණයක් දැල්වෙනවා ද? අපට රාත්‍රි කාලයේ දී පහසුවෙන් පාරේ ගමන් කිරීමට විදුලිය ලබා දී කණුවලට සවි කර ඇති පහන් නිවා නොදැමීම නිසා දිවා කාලවලත් දැල්වෙන බව
  - * විදුලි පංකා, වායුසමීකරණ යන්ත්‍ර නිකරුණේ ක්‍රියාත්මක කර තිබීම නිසා විදුලිය නාස්ති වන බව
  - * ලැබෙන ජලය ප්‍රමාණය පිරිමැස්මෙන් පාවිච්චි නොකිරීම නිසා අපතේ යාම හා විශාල මුදලක් ඒ සඳහා ගෙවීමට සිදුවන අවස්ථා ද ඇති බව
  - * නිවසේ, පාසලේ භාවිත කරන උපකරණ ක්‍රමයෙන් අබලන් වුවත් අලුත්වැඩියා නොකිරීම නිසා විනාශ වන බව
  - * සමහරු පොතක් පිටකවරයක් ගැලවුණත් එම පොත පාවිච්චියට ගන්නේ නැති බව

අභ්‍යාස පොතෙහි හිස් පිටු තිබුණ ද එය ඉවත දමා අලුත් පොත් මිල දී ගන්නා බව

* අඳින ඇඳුම ටිකක් ඉරුණොත් එය මසා අඳින්නට පුරුද්දක් නැතිකම

ආදි කරුණු නිසා ලද දෙයින් සතුටට පත් ව නිසි ප්‍රයෝජන නොගැනීම නිසා ධනය විනාශ වන බවත්, එමගින් දියුණු වීමට ඇති අවස්ථා මගහැරෙන බවත් සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම 2**

පියවර 1 : • හොඳ යහළුවන්ගේ ඇසුර තමන්ගේ දියුණුවට හේතුවන බව පහත සඳහන් කරුණු ඔස්සේ සාකච්ඡා කරන්න.

* යහපත් මිතුරා තමන් නිතර වැරදිවලින් වළක්වයි.
* යහපත් මිතුරා හොඳ දේ (පින්) කිරීමට පොලඹවයි.
* හොඳ දේ කරන්න උදවු කරයි.
* කරදරයක්, විපතක් වූ විට අත්නොහැර සිටී.
* සහයෝගයෙන් වැඩ කරයි.
* බොරු නොකියයි. සත්‍යවාදී වෙයි.

පියවර 2 : • යහළුවන්ගේ ඇසුර නිසා මිනිසුන් වෙනස් වන ආකාරය සත්තිගුම්බ ජාතකය ඇසුරින් කියා දෙන්න.

**සත්තිගුම්බ ජාතකය - 495**

කැලේ ගසක ගිරා කූඩුවක ගිරා අම්මා, තාත්තා හා පැටවු දෙන්නෙකු සිටියා. අම්මයි, තාත්තයි කෑම හොයන්න ගිය වෙලාවේ මහා සුළඟක් ආවා. ගිරා පැටවුන් දෙන්නා සුළඟේ ගසාගෙන ගියා. කන්දේ දෙපැත්තට දෙන්නා වැටුණා. එක් පැටියකු සොරුන් ළඟට වැටුණා. අනෙක් පැටියා තවුසන් සිටින අසපුවක් ළඟට වැටුණා.

දවසක් දඩයමේ ආ රජ කෙනෙකු කැලයේ අතරමං වුණා. වෙහෙස නිසා රජතුමා ගසක් යට නිදා ගත්තා. ''අල්ලපියවු, මරපියවු, කොටපියවු, ගහපියවු'' ලෙස කෑගසනවා රජතුමාට ඇසුණා. රජතුමා එය අසා ඉක්මන් කරලා කන්දේ අනෙක් පැත්තට ගියා.

''එන්න පින්වත, ඔබට මහන්සි ඇති නේද? මේ පැන් බොන්න. මේ පලතුරු කන්න'' ලෙස කතා කරන මිහිරි කටහඬක් රජතුමාට ඇසුණා. රජතුමා පුදුම වුණා. එක් ගිරවකු සැර පරුෂ ව කතා කළා. අනෙක් ගිරවා ආදරයෙන් කතා කළා. මේ ගැන අසල සිටි තාපස තුමන්ගෙන් ඇසුවා.

''පුදුම වෙන්න එපා රජතුමනි. මේ ගිරවු දෙදෙනා එක ම දෙමාපියන්ගේ දරුවෝ. එක ම කූඩුවේ හැදුණේ. සුළඟට හසු ව දෙදෙනා දෙපැත්තට වැටුණා. හොඳ ඇසුර නිසා මේ ගිරවා හොඳ අයකු වුණා. නරක ඇසුර නිසා ඒ ගිරවා නරක අයකු වුණා. ඇසුර හැමෝම වෙනස් කරනවා'' තාපසතුමා කීවා.

**ක්‍රියාකාරකම 3**

පියවර 1 : • පන්සිල් පද පහෙහි හතර වන සිල්පදය පිළිබඳ ව දරුවන් සමඟ කතා කරන්න.

• හතර වන සිල්පදය හඬනගා කියවන්න. ඇත්ත කතා කිරීමේ අගය පැහැදිලි කර දෙන්න. උදාහරණ යොදා ගන්න.

පියවර 2 : • පහත සඳහන් කවිය තාලයට ගායනා කරන්න.

• හොඳ හා නරක (සත්‍ය වචන හා බොරු) කතා කරන්නේ කටින් ම බවත්, සත්‍ය කතා කරන දරුවන්ගේ කටින් මල් සුවඳ පැතිරෙන බවත්, බොරු වචන කතා කරන විට දුගඳ හමන බවත් කියා දෙන්න.

මහනෙල් සුවඳ ම ය - කුඩ මසු පිළී ගඳම ය
දෙකට එක දිය ම ය - හොඳට නරකට දෙකට කට ම ය

(සිරිත් මල්දම)

**ක්‍රියාකාරකම 4**

පියවර 1 : • සුභාෂිත වචන යනු තමන්ටත්, අනුන්ටත් ප්‍රිය උපදවන, සිත සතුටු කරවන වචන බව කියා දෙන්න.

• සතුන් ද ප්‍රිය වචනවලට කැමති බව නන්දිවිසාල ජාතකය මතක් කරමින් සාකච්ඡා කරන්න.

පියවර 2 : • කොළ රහිත ගසක ආකෘතියක් සකස් කර දරුවන් කණ්ඩායම් කර, තමා උගත් ප්‍රිය වචන ගසේ කොළ සේ සාදාගත් කාඩ්බෝඩ්වල ලියන්නට දෙන්න.
*උදා* : පින් සිදුවේවා, බොහොම ස්තුතියි, වාඩිවෙන්න . . . ආදි ලෙස

• කණ්ඩායම් ලෙස සකස් කරගත් වචන ලියන ලද කොළ ගසේ එල්ලා ප්‍රදර්ශනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

• අවශ්‍ය අවස්ථාවල දී මෙවැනි වචන භාවිත කිරීමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 5**

පියවර 1 : • පරිසරය අපිරිසිදු වන්නේ මිනිස් ක්‍රියාකාරකම් නිසා බව රූප රාමු භාවිතයෙන් කියාදෙන්න.

• අපිරිසිදු පරිසරය නිසා බෝවන ලෙඩරෝග පිළිබඳ ව දරුවන්ගෙන් විමසන්න.

• පරිසරය අපිරිසිදු වීම නිසා සතුන්ට හා මිනිසුන්ට සිදුවන විපත් රූප රාමු සහිත ව කියාදෙන්න.

පියවර 2 : • ශ්‍රමදානයක් පවත්වා පාසල් පරිසරය පිරිසිදු කරන්න.

**ක්‍රියාකාරකම 6**

පියවර 1 : • සිසුන් කිහිපදෙනෙකුගෙන් තම පවුලේ සාමාජිකයන් ගැන විමසන්න.

• ඒ ඒ සාමාජිකයාට පවුලේ අයත් වටිනාකම සාකච්ඡා කරන්න.
*උදා* : අම්මා, තාත්තා, ආච්චි, සීයා, අයියා, අක්කා, . . . ආදි ලෙස

• පවුලේ සාමාජිකයන්ගේ සමඟිය පවුලේ දියුණුවට හේතුවන බව කියා දෙන්න.

පියවර 2 : • පවුලේ සාමාජිකයන්ගේ ඇසුර නිසා තමන්ට ලැබෙන ප්‍රයෝජන වගුගත කරන්නට දෙන්න.

• පවුලේ සාමාජිකයන් සමඟ ආදරයෙන් හා කරුණාවෙන්, කීකරු ව කටයුතු කිරීමෙන් සිසුන්ට ලැබෙන ප්‍රයෝජන සාකච්ඡා කරන්න.

**තක්සේරුව** : • සැම විට ම සත්‍ය වචන කතා කරයි.

• පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි.

**ප්‍රායෝගික ජීවිතය සඳහා**

- යහපත් මිතුරන් ඇසුරු කිරීම සහ ප්‍රිය වචන කතා කිරීම
- පවුලේ සියලු දෙනාම එක් වී සමඟියෙන් ගෙවත්ත පිරිසිදු කිරීම

## 6.0 තේමාව : බෞද්ධ උපදේශ කාව්‍ය වනපොත් කර ගනිමින් ආදර්ශවත් ජීවිතයක් ගොඩනගා ගැනීම

**නිපුණතාව** : **බෞද්ධ උපදේශ කාව්‍ය වනපොත් කරයි.**

**ඉගෙනුම් පල** :
- බෞද්ධ උපදේශ කාව්‍ය තාලයට ගායනා කරයි.
- බෞද්ධ උපදේශ කාව්‍ය ඇතුළත් පොත් පිංචක් සකස් කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- උපදේශ කාව්‍ය ලියාගත් පුවරු
- කාව්‍යන්ට අදාළ ව සකසා ගත් විශාල රූප රාමු

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :
- එදිනෙදා ජීවිතයේ උදාහරණ ගෙනහැර දක්වමින් අප විසින් සිදු කරනු ලබන අනවශ්‍ය අපතේ යාම් පිළිබඳ ව කතාබහක් අරඹන්න.
- ප්‍රයෝජනයට ගත හැකි අපතේ යන දේවල් මොනවාදැයි සිසුන්ගෙන් ද අසා දැන ගන්න.
- ඒවා ප්‍රයෝජනයට ගත හැකි ආකාරය කතාබහ කරන්න.

  *උදා :* * අපතේ යන දේවලින් විසිතුරු නිර්මාණ කළ හැකි බව
  * වෙන අයකුට ප්‍රයෝජනයට ගැනීමට ලබාදිය යුතු බව

පියවර 2 :
- ගත හැකි දෙය වැඩට
  අහක නොදමනු කිසි විට
  වැඩ නැති දෙය නුඹට
  දෙනුව ඉන් වැඩ ගන්න අය හට
- සිසුන් සවන් දීමට යොමු කර කවිය රසවත් ව ගායනා කරන්න.
- කවියේ අදහස සිසුන්ට පැහැදිලි කරන්න.
  * හැම දෙයකින් ම හැකි උපරිම ප්‍රයෝජන ගත හැකි බව
  * තමන්ට වැඩකට නැති එහෙත් තවත් කෙනෙකුට ප්‍රයෝජනයට ගත හැකි මට්ටමේ පවතී නම් එවැනි දේ වැඩක් ගන්නා අයට හොඳ සිතින් ම ලබා දිය යුතු බව

පියවර 3 :
- කවිය කටපාඩමෙන් කියන්නට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2**

- අපතේ යන දේවලින් කැමති නිර්මාණයක් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

  *උදා :* * විසිතුරු බඩු නිර්මාණය * පැන්සල් රඳවනයක් නිර්මාණය
  * පාපිසි නිර්මාණය * වැඩ මල්ලක් සැකසීම
  * කාඩ් නිර්මාණය * දූවිලි පිස්නා සැකසීම . . . වැනි
- සකස් කරන ලද නිර්මාණ එදිනෙදා ප්‍රයෝජනයට ගැනීමට හෝ ප්‍රයෝජනයට ගත හැකි කෙනෙකුට දීමට හෝ යොමු කරන්න.

**ක්‍රියාකාරකම 3**

පියවර 1 :
- 'බුදු ගුණ අසමින් සිත සතපායේ' කවිය ලියා ගත් පුවරුව ප්‍රදර්ශනය කරන්න.
- කවියට අදාළ ව සකසා ගත් පින්තූර ද ප්‍රදර්ශනය කරන්න.
- කවිය තාලයට ගායනා කරන්න.

- එහි තේරුම සිසුන්ට පහදා දෙන්න.

***කවිය :***

බුදුබණ අසමින් සිත සත පායේ
කුරු පණ කම් ඇර පිය ඒ හායේ
පර පණ නැසුවොත් කවර උපායේ
අපමණ දුක් දෙයි සතර අපායේ

ලෝවැඩ සඟරාව - 77 කවිය.

***තේරුම :*** 'බුදු බණ අසමින් සිත සංසිඳුවාගෙන ඒ පාපී නීච ක්‍රියා අත් හැර දමනු. කවර උපායකින් නමුත් අනුන්ගේ ජීවිත නැති කළහොත් අපාය සතරෙහි සීමාවක් නැති දුක් ලැබෙයි.'

පියවර 2 :
- ගුරුතුමිය කවිය කිහිප විසින් ගායනා කරන්න.
- සිසුන් ලවා ද ගායනා කරවන්න.
- කවිය වනපොත් කරන්නට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 4**

- අදාළ උපදේශ කවි දෙක පිටපත් කර කවිවලට අදාළ පින්තූර ඇඳීම හෝ ඇලවීම හෝ සිදු කර කුඩා පොත් පිංචක් සැකසීමට සිසුන් යොමු කරන්න.

**තක්සේරුව :**
- අපතේ යන දේවලින් ප්‍රයෝජනවත් යමක් නිර්මාණය කරයි.
- බෞද්ධ උපදේශ කාව්‍යයක් කටපාඩමින් ගායනා කරයි.

**ප්‍රායෝගික ජීවිතය සඳහා**

- අපතේ යන දේවල් ප්‍රයෝජනයට ගත හැකි අයට දීම
- ඉවත ලන දෙයක් ඇසුරෙන් ප්‍රයෝජනවත් යමක් නිර්මාණය කිරීම

## 7.0 තේමාව : හිතකර දෛනික චර්යා රටාවක් ගොඩනඟා ගනිමින් සෞඛ්‍යවත් ජීවිතයක් ගත කිරීම.

**නිපුණතාව** : **හිතකර දෛනික චර්යා රටාවක් ගොඩනඟා ගනිමින් සෞඛ්‍යවත් ජීවිතයක් ගත කරයි.**

**ඉගෙනුම් පල** :
- නියමිත වේලාවට අවදිවීම පුහුණු විය යුතු බවට යෝජනා කරයි.
- උදෑසන ම පිරිසිදු වතුර වීදුරුවක් පානය කිරීමේ වැදගත්කම පිළිගනිමින් කතා කරයි.
- පාසල ආරම්භයට පෙර පාසල් යෑම සුදුසු බවට යෝජනා කරයි.
- ගෙදර දොර කටයුතුවලට උදවු කිරීමේ වටිනාකම අගය කරමින් කතා කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- යහපත් දින චරියාවකට අදාළ පින්තූර
- පාඩමට අදාළ කවි ලියන ලද පුවරු
- කවි ඇතුළත් සංයුක්ත තැටි හෝ හඬ පට
- භාවනාව සඳහා වාඩි වීමට අවශ්‍ය පැදුරු හෝ ඉටි රෙදි

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :
- නියමිත වේලාවට අවදි වීම නිසා මුළු දවසේ ම කටයුතු සාර්ථක කර ගැනීමට හැකි වන බව පැහැදිලි කරන්න.
- උදෑසන ම පිරිසිදු වතුර වීදුරුවක් පානය කිරීමෙන් නීරෝග සම්පන්න වීමට හැකි බව පහදා දෙන්න.
- 'ඉර උදාවන්නට . . . ' කවිය ඇසුරින් එහි අන්තර්ගතය පිළිබඳ ව ආකල්ප ඇති කරන්න.

පියවර 2 :
- උදෙන් ම අවදි වීමෙන් පාසල් වැඩ කටයුතුවලට පහසුවෙන් සූදානම් විය හැකි බව සහ නියමිත වේලාවට පෙර පාසලට යෑමට හැකි වීම පිළිබඳ සාකච්ඡා කරන්න. ( පොත්පත් සකසා ගැනීම්, පාසල් යාමට අවශ්‍ය සූදානම් වීම්)
- ආහාර ගෙන හොඳින් පිරිසිදු වී පිරිසිදු ඇඳුම් ඇඳ දෙමාපියන් වන්දනා කර පාසලට පිටත්වීමේ වැදගත්කම පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම 2**

පියවර 1 :
- ගුරුතුමා/තුමියගේ මඟ පෙන්වීම් යටතේ කාල සටහනට අනුව ඉගෙනීමේ කටයුතුවල නිරත වීමේ වැදගත්කම පිළිබඳ ව කතාබහ කරන්න.

පියවර 4 :
- සිදුහත් කුමාරයා මෙන් ගුරු බසට කීකරු වී හොඳින් ශිල්ප ඉගෙන ගත යුතු බව පහත කවිය ද භාවිත කරමින් කියා දෙන්න.

  'ගුරු සිත නොරිදවා - වේලාව නොවරදවා
  බැති පෙම් උපදවා - අකුරු උගනී කුමරු සොඳවා'

පියවර 3 :
- පාසලේ දී විවේක කාලය හොඳින් ගත කිරීම, සෙල්ලම් කිරීම, විවේකයෙන් පසු නැවත ඉගෙනුම් කටයුතුවල යෙදීම, පන්තිය සකස් කොට තෙරුවන්ගේ ආශීර්වාදය ලබාගැනීම, ගුරුවරයාට වැඳ ආශීර්වාද ගෙන පන්තියෙන් පිටත්වීම යනාදියෙහි වැදගත්කම කියා දෙන්න. ඒ සඳහා පහත කවිය යොදා ගන්න.

විවේකය ගත කොට
ඉගෙනුම් කරනු සතුටින
පන්තිය සකස් කොට
පිටත් වී යා යුතු ය බැතියෙන

**ක්‍රියාකාරකම 3**

පියවර 1 :
- පාසල ඇරී නිවසට පැමිණීමෙන් අනතුරුව කෙටි වේලාවක් විවේක ගත යුතු බව පහදා දෙන්න.
- පාසල් නිල ඇඳුම් (සපත්තු, මේස්, ටයි පටිය) පිරිසිදු කර නියමිත තැන්වල තැබීමේ වැදගත්කම පිළිබඳ ව සිසුන්ගෙන් ද අදහස් විමසමින් සාකච්ඡා කරන්න.

පියවර 2 :
- ගෙදර දොර කටයුතුවලට උදවු කිරීමේ, තමන්ට කළ හැකි කටයුතු තමන් විසින් ම කර ගැනීමේ වැදගත්කම පිළිබඳ ව පහත කවිය ද යොදා ගනිමින් පැහැදිලි කරන්න.

ගෙදොර සැම කටයුතු
හොඳින් සලකා කළ යුතු
කීවට නොකළ යුතු
කරමු සතුටින් බලා කටයුතු

පියවර 3 :
- නිරෝගී පැවැත්මක් සඳහා ක්‍රීඩා කිරීමේ වැදගත්කම අවබෝධ කරමින් සවස් කාලයේ ක්‍රීඩාවක නිරත වීම ද සුදුසු බව අවධාරණය කරන්න.

**ක්‍රියාකාරකම 4**

- සවසට හොඳින් පිරිසිදු වී නියමිත පරිදි සූදානම් ව බුද්ධ වන්දනාවේ යෙදීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.
- මනස සන්සුන් වන සරල භාවනාවක යෙදීම අවශ්‍ය බව කියා දෙන්න.
- 'මගේ සිත පිරිසිදුය පිරිසිදු ය . . .' කවිය භාවිත කරමින් නිදහස් පරිසරයකට දරුවන් රැගෙන ගොස් මෛත්‍රී භාවනාවක නිරත වීමට දරුවන් යොමු කරන්න.
- පාසලේ දී උගත් දේ නැවත මතක් කර ගැනීම, පසුදිනට සූදානම් වීමේ වැදගත්කම පිළිබඳ ව සිසුන්ගෙන් ද විමසමින් සාකච්ඡා කරන්න.
- රාත්‍රි ආහාර ගෙන දෙමාපියන් වන්දනා කර සතුටු සිතින් නින්දට යාම සුදුසු බව පැහැදිලි කර දෙන්න.

**තක්සේරුව :** • පාසල ආරම්භයට පෙර පාසලට පැමිණෙයි.

**ප්‍රායෝගික ජීවිතය සඳහා**

- උදෑසනින් අවදි වී පිරිසිදු වතුර වීදුරුවක් පානය කිරීම.
- ගෙදරදොර කටයුතුවලට හැකි පමණින් උදවු වීම.

# 8.0 තේමාව : ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවල යෙදෙමින් දැහැමි හා සැපවත් ජීවිතයක් ගත කිරීම

**සීල සමාදාන වැඩසටහන**

**නිපුණතාව** : **ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවල යෙදෙමින් දැහැමි හා සුවදායී ජීවිතයක් ගත කරයි.**

**ඉගෙනුම් පල** :
- සලාක දානය පූජා කරන ආකාරය විස්තර කරයි.
- සැදැහැ සිතින් යුක්ත ව මල් දන්සල පවත්වයි.
- තමාගේ පටන් තම සමීපතමයන් දක්වා මෛත්‍රිය පතුරවයි.
- සැලසුම් සහගත ව ශීල භාවනා වැඩ සටහනක නිරත වෙයි.

**ඉගෙනුම් සම්පත්** :
- අවශ්‍ය රූප රාමු
- පෝස්ටර් සැදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
- මල් දන්සල සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
- සීල සමාදාන වැඩසටහන සඳහා අවශ්‍ය ද්‍රව්‍ය

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### සලාක දානය

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :
- මහා සංඝරත්නයට දන් පූජා කිරීම පිළිබඳ ව පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.
  * දානය යනු යමක් යම් කෙනෙකුට දීම බව
  * දානය පූජා බුද්ධියෙන්, අනුග්‍රහ බුද්ධියෙන් හා අනුකම්පා බුද්ධියෙන් දිය හැකි බව
  * පූජා බුද්ධියෙන් දන් දෙන්නේ බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට, වැඩිහිටියන්ට බව කියා දෙන්න.
  * අනුග්‍රහ බුද්ධියෙන් දීම නම් සමිති සමාගම්වලට හා වෙනත් ස්ථානවලට පරිත්‍යාග කිරීම, සාමාජික මුදල් ගෙවීම වැනි අනුග්‍රහ දැක්වීම බව පැහැදිලි කරන්න.
  * අනුකම්පාවෙන් දන් දීම යනු දුගී මඟී යාචකාදීන්ට පරිත්‍යාග කිරීම බව කියා දෙන්න.
- මෙහි දී මහා සංඝරත්නයට දන් දීමේ දී පන්සලට දානය ගෙනගොස් දීමත්, ස්වාමීන් වහන්සේලා ගෙදරට වැඩම කරවා දන් දීමත් කළ හැකි බව කියා දෙන්න.

පියවර 2 :
- සලාක දානය යනු පන්සලට ගෙනගොස් මාසික ව, ත්‍රෛමාසික ව හෝ වාර්ෂික ව හෝ දෙන දානය බව කියා දෙන්න.
  * විවිධ පළාත්වල සලාක දානය සඳහා භාවිත වන වචන හඳුන්වා දෙන්න. (පේරු දාන, මුර දාන, මාස දානය)
  * පළාත්වල සකසා ගත් සම්ප්‍රදාය පවතී නම් ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- පන්සලේ ස්වාමීන් වහන්සේ, දායක සභාව සමඟ සාකච්ඡා කොට සලාක දානයට දින නියම කර ගන්නා බව පවසන්න.
- අතීතයේ සලාක දානය පූජා කළ ආකාරය පිළිබඳ ව සිසුන්ට කියා දෙන්න. ඒ සඳහා විවිධ හේතු බලපා ඇති බව

  *උදා* :
  * යුතුකමක් සේ සැලකීම
  * මියගිය අය සිහිපත් කරමින් පින් දීම සඳහා
  * දායක පවුල්වල අයගේ ජීවිතයේ විශේෂ දින සිහිපත් කිරීම සඳහා

**ක්‍රියාකාරකම 2**

පියවර 1 :
- සලාක දානය රැගෙන යන ආකාරය පිළිබඳ ව පහත කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.
    - * පෙරදින විහාරස්ථානයට ගොස් දැහැත් ගිලන්පස පූජා කර අවසර ලබා ගන්න.
    - * සකස් කර ගත් දානය විහාරස්ථානයට රැගෙන යාම. (දානය පිසින ලද භාජන පිටින් රැගෙන යාම, දන් පෙට්ටිය හිස මත තබාගෙන දානය රැගෙන යාම, විහාරස්ථානයෙන් දෙන භාජනවලින් දානය රැගෙන යාම, . . . ආදිය)
- දාන ශාලාව පිරිසිදු කොට රැගෙන ගිය දානය පිළිවෙළට තබා බුද්ධ පූජාව සකස් කිරීම.

පියවර 2 :
- ස්වාමීන් වහන්සේගේ ද මඟ පෙන්වීම අනුව බුද්ධ පූජාව පූජා කරන බව
- ස්වාමීන් වහන්සේලාට සියතින් දන් පූජා කර, පින් ලබා ගන්නා බව (ප්‍රාදේශික ව ඇති වෙනස්කම් පිළිබඳ ව සැලකිල්ලට ගෙන මෙම පාඩම සකසා ගන්න.)
- සලාක දානය පූජා කිරීමේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නඟන්නට සිසුන් යොමු කරන්න.

## මල් දන්සල

**ක්‍රියාකාරකම 3**

පියවර 1 :
- දන්සල් පැවැත්වීමේ විවිධ ක්‍රම පවතින බව දරුවන් සමඟ සාකච්ඡා කරන්න. (2 ශ්‍රේණියේ දී උගත් පාඩම් සිහියට නඟන්න.)
- විවිධ මල් වර්ගවලින් සම්බුද්ධ පූජා පවත්වන බව රූප රාමු ද භාවිත කරමින් සාකච්ඡා කරන්න.
- මල් දන්සලේ වටිනාකම පහත සඳහන් සුමන මාලාකරුගේ කතාව ඇසුරින් පැහැදිලි කරන්න.
- බෞද්ධ චරිත කතාවක් මේ සඳහා සම්බන්ධ කර ගන්න.
- අතීතයේ සිට මෙවැනි ආකාරයේ මල් පූජා කළ බව කියා දෙන්න.
- මල් දන්සල පිළිබඳ ව පෝස්ටරයක් නිර්මාණය කර ප්‍රදර්ශනය කරන්න.

### සුමන මාලාකරුගේ කතාව

බිම්බිසාර මහ රජතුමාට දින පතා මල් සපයන 'සුමන' නමින් මල්කරුවෙක් වෙයි. සපයන මල් වෙනුවෙන් සැම දිනකට ම රන් කාසි 8ක් ඔහුට රජ ගෙදරින් ලැබේ. එක් දිනක් වනයට ගොස් වෙහෙස ව නෙළා ගත් මල් රජුට ගෙන යන අතරතුර දී බුදු රජාණන් වහන්සේ සමඟ වඩින මහා සංඝරත්නය හමු වේ. සුමන මාලාකරු ශ්‍රද්ධාවෙන් පිනා යයි. දන් දීමට තමන් සතු ව මල් හැර කිසිත් නැති කල රජුන් වෙත ගෙන යෑමට සකස් කළ සියලු මල් බුදු රජාණන් වහන්සේ ඇතුළු පිරිසට දන් දෙන ලදි. පූජා කරන ලදි. සුමන පිදූ ඒ සුවඳ මලින් බුදුන් වහන්සේ වටා මල් වියනක් සැදේ. බුදුන් වහන්සේ මල් වියන තුළින් රජගහ නුවර වීදියට වඩිති. එය දුටු සැදැහැති මිනිස්සු සාධුකාර පවත්වති. සාධුකාර හඬ ඇසූ බිම්බිසාර රජතුමා ද සැදැහැ සිතින් බුදුන් වහන්සේ ඉදිරියට පැමිණෙයි. පසඟ පිහිටුවා බුදු රජාණන් වහන්සේ වන්දනා කරයි. අසල සිටි සුමන මාලාකරු දැක රජතුමා ඔහු කැඳවයි. සුමන කළ පින්කම ගැන අසා රජතුමා සතුටු වෙයි. දුප්පත් සුමනට භවභෝග සැප සම්පත් ලබා දෙයි. සුමන සතුටට පත් වෙයි. මල් දන් දුන් පිනෙන් සුමන මියගොස් අනාගතයේ දී පසේ බුදුවරයකු බවට පත් වී පිරිනිවනට පත් වෙයි.

පියවර 2 : • දන්සල පවත්වන්නේ විහාරස්ථානයක ද, පාසලේ ද යන්න පිළිබඳ ව තීරණය කරන්න.

• සුදුසු පොහෝ දිනයක් යොදා ගනිමින් මල් දන්සලක් සැලසුම් කරන්න.

  * මල් එකතු කර ගැනීම
  * මල් දන්සල පවත්වන වේලාව
  * මල් ධෝවනය කිරීම
  * පොලිතින් භාවිතයෙන් තොර ව මල් අන් අයට පරිත්‍යාග කරන ආකාරය (වට්ටියක ද?, කොළවල ද යන්න)
  * දරුවන්ගේ ආරක්ෂාව සකසා ගත යුතු ආකාරය

**ක්‍රියාකාරකම 4**

පියවර 1 : • සැලසුම් කළ දිනයට මල් දන්සල පවත්වන්න.

• මෙහි දී, දරුවන්ට අත්දැකීම ලබා දෙන ආකාරය, දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන්න.

• දන්සල පැවැත්වූ ස්ථානය පිරිසිදු කරන්න.

**ක්‍රියාකාරකම 5**

පියවර 1 : • බුද්ධ වන්දනාව පවත්වා පින් රැස් කරගත් ආකාරය, මල් දන්සල පිළිබඳ ව දරුවන්ගේ ද අදහස් සලකමින් සාකච්ඡා කරන්න.

• මල් දන්සල පැවැත්වූ දිනයේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නඟන්නට සිසුන් යොමු කරන්න.

**අටසිල් සමාදන් වීම හා මෛත්‍රී භාවනාව**

**ක්‍රියාකාරකම 6**

පියවර 1 : • සීල සමාදානය පිළිබඳව දරුවන්ගේ අත්දැකීම් විමසන්න.

• පහත කරුණු ද අවධාරණය කරමින් සිල් සමාදන් වන ආකාරය පිළිබඳ ව සාකච්ඡාවක නිරත වන්න.

  * පෙර දින සූදානම
  * සිල් සමාදන් වන විට අඳින ඇඳුම්
  * භාවිත කරන වචන
  * හැසිරිය යුතු ආකාරය
  * සීල සමාදානයට අවශ්‍ය පරිදි ස්ථානය සකස් කර ගන්නා ආකාරය

• සීල සමාදානය සඳහා පෙර පොහෝ වැඩසටහනක් සූදානම් කර ගන්න. (විහාරස්ථානයක් යොදා ගන්නේ නම් වඩාත් සුදුසු ය.)

• මේ සඳහා දෙමාපිය සහභාගිත්වය ද ලබා ගන්න.

**ක්‍රියාකාරකම 7**

පියවර 1 : • නියමිත දිනයේ දී අටසිල් සමාදන් වීමේ වැඩසටහනක් පවත්වන්න.

• මෙහි දී , * ශාසනික වචන භාවිතයට යොමු කිරීම
  * නිවැරදි ව වත් පිළිවෙත් සිදු කිරීම ආදිය පිළිබඳ අවධානය යොමු කරන්න.

පියවර 2 : • අටසිල් සමාදන් වීමේ දිනයේ දී ම ස්වාමීන් වහන්සේ නමකගේ අනුශාසනා ඇති ව මෛත්‍රී භාවනා කිරීමේ අවස්ථාවක් සැලසුම් කර ගන්න.

- මෙහි දී, * භාවනාව සඳහා වාඩි වන ආකාරය
  * දෑත් තබාගන්නා ආකාරය ආදිය පිළිබඳ ව පිළිවෙළින් සිසුන්ට කියා දෙන්න.
- තමාගේ පටන් සමීපතමයන් තෙක් මෛත්‍රිය වැඩීම පිළිබඳ භාවනාවේ නිරත කරවන්න.

**තක්සේරුව :**
- සලාක දානය පූජා කරන අනුපිළිවෙළ විස්තර කරයි.
- මෛත්‍රී භාවනාවෙහි යෙදෙයි.

**ප්‍රායෝගික ජීවිතය සඳහා**

- නිවැසියන්ගේ සහය ඇති ව ගමේ පන්සලට සලාක දානයක් පූජා කිරීම
- නිවසේ දී බුද්ධ වන්දනාවට අවශ්‍ය මල් නෙළා සකස් කර නිවසේ අය සමඟ බුද්ධ වන්දනාවේ යෙදීම.

## 9.0 තේමාව : සුවිශේෂ බුදු වදන් හදාරමින් ධර්මචාරී ජීවිතයක් ගොඩනගා ගැනීමට ක්‍රියා කිරීම

**නිපුණතාව** : සුවිශේෂ බුදු වදන් හදාරමින් ධර්මචාරී ජීවිතයක් ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** :
- බුදු වදන් තම ජීවිතයට එකතු කර ගැනීමට කැමැත්තක් දක්වයි.
- සුවිශේෂ බුදු වදන් කිහිපයක් පන්තියේ ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- අදාළ කවි ලියන ලද පුවරු
- බුදු වදන් ලියන ලද පුවරු
- ජාතක කථාවට අදාළ පින්තූර
- සංයුක්ත තැටි හෝ හඬ පටි

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- සිසුන් සතුටින් සිටීම සඳහා කටයුතු කරන ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න.
  * සෙල්ලම් කිරීම
  * පරිසරය අලංකාර කිරීම
  * අනුන්ට උපකාර කිරීම
  * කැමති ගුණදායක ආහාරපාන ගැනීම
- ගුරු සාකච්ඡාවේ දී සතුටු වීම සඳහා යොදා ගත් අවස්ථා කීපයක් පෙන්වන්න. (පින්තූර)
  * මනා ව පන්ති කාමරය සකස් කර ගැනීම
  * ඉගෙන ගන්නා අවස්ථාවල දී අපහසුතා ඇති දරුවන්ට උදවු කිරීම
  * තමා අනුභව කරන ආහාරයෙන් කොටසක් දන් දීම
  * දෙමාපියන්ට කරදරයක් නොවන සේ තම කටයුතු කර ගැනීම
  * සමඟියෙන් ක්‍රීඩාවේ නිරත වන අවස්ථා
  * තෙරුවන් වන්දනා කිරීම
- මේ සඳහා පින්තූර ඉදිරිපත් කරමින් සාකච්ඡා මෙහෙයවන්න.
- සිරිත් මල්දමේ පහත සඳහන් කවිය යොදා ගන්න.

නිසි පිළිවෙළ රැගෙන - සියුම් පිරිසිදුකම ගෙන
ඇද නැති ගතිය ගෙන - සියලු වැඩපල කරන් සතුටින

පියවර 2 :
- 'සන්තුට්ඨී පරමං ධනං' යන බුදු වදන නිවැරදි ව ශබ්ද වන පරිදි උච්චාරණය කරයි.
- සතුට උතුම් ධනය බව, බුදු වදන සාකච්ඡාවෙන් තහවුරු කරන්න.
- 2 ශ්‍රේණියේ උගත් කරුණු ද සිහිපත් කරමින් 'ආරෝග්‍ය පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං' යන ගාථාව කොසොල් රජතුමාට බුදු රජාණන් වහන්සේ දේශනා කළ බව කියා දෙන්න. (බුද්ධ ධර්මය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, 18 පිටුව)

**ක්‍රියාකාරකම 2**

නහි වේරේන වේරානි
සම්මන්තීධ කුදාචනං
අවේරේනච සම්මන්තී
ඒස ධම්මෝ සනන්තනෝ

පියවර 1 : • වෛර කිරීමෙන් තමන්ට සිදුවන අයහපත හා වෛර නොකිරීමෙන් සිදුවන යහපත් සිසුන් ද සම්බන්ධ කර ගනිමින් කියා දෙන්න. අවශ්‍ය නම් රූප රාමු ද භාවිත කරන්න.

පියවර 2 : • ඉහත ගාථාව තාලයට ගායනා කරන්න.

• එහි සරල තේරුම කියා දෙන්න.

'වෛරයෙන් වෛරය නොසන්සිඳේ
වෛර නොකිරීමෙන් වෛරය සන්සිඳේ'

• මෙම පාඨය ධම්මපදයේ යමක වග්ගයේ 5වන ගාථාව ය. (අදාළ කතාව ධම්මපදට්ඨ කතාවෙහි දක්වේ.)

**ක්‍රියාකාරකම 3**

පියවර 1 : • දීඝිති කෝසල ජාතකය උදාහරණයට ගනිමින් වෛර නොකිරීමේ වටිනාකම පැහැදිලි කරන්න.

• මෙම කතාව සරල ව පින්තූර ඉදිරිපත් කරමින් දරුවන්ට පහත දක්වෙන කරුණු ද ඉදිරිපත් කරමින් කියා දෙන්න.

අතීතයේ බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජෙක් රාජ්‍ය කළේ ය. ඒ කාලයේ ම කොසොල් රටේ රජ කළේ දීඝතිස්ස කෝසල රජු යි. බ්‍රහ්මදත්ත රජු යුද්ධ ශක්තියෙන් බලවත් ය. ගුණ යහපත්කමින් දුබල ය. සෑම විට ම අනෙක් රාජ්‍යයන් යටපත් කර ගන්නට උත්සාහ ගනියි.

දීඝතිස්ස රජු ගුණවත් ය. එසේ ම ප්‍රඥාවන්ත ය. කිසි විටෙකත් අන් රාජ්‍යයන්ට ආශාවක් නොවී ය. බ්‍රහ්මදත්ත රජු දීඝතිස්ස රජු සමඟ යුද්ධයකට එළඹිණි. යුද්ධයෙන් මිනිසුන් සිය දහස් ගණනක් මැරෙනු දකීමට අකමැති වූ කොසොල් රජු (දීඝතිස්ස) තම දේවිය ද සමඟ රාජ්‍යය අතහැර වෙනත් ප්‍රදේශයකට වෙස් වළාගෙන ගොස් කුඹල්කරුවකු සේ ජීවත් විය. මේ කාලයේ රජ දේවියට පුතෙක් උපන්නේ ය. ඔහුට 'දීඝායු' නම තැබීය. දීඝායු කුමරුගේ ආරක්ෂාව ගැන සිතූ දෙමාපියෝ ඔහු පිටිසර ප්‍රදේශයකට යවා අප්‍රසිද්ධියේ ජීවත් වීමට ඉඩ සැලැස්වූහ.

දීඝතිස්ස රජු හා බිසව අල්ලාගත් බ්‍රහ්මදත්ත රජු වධ බෙර වයමින් වීදියක් වීදියක් පාසා ගෙන ගොස් හිසගසා මරා දැමී ය. මේ අවස්ථාව දකින දීඝායු කුමාරයා කලබල වේ යැයි සිතූ දීඝතිස්ස රජු, ''පුත, දීඝායු දුර බලන්න, ළඟ නොබලන්න. වෛරයෙන් වෛරය නොසන්සිඳේ. අවෛරයෙන් වෛරය සන්සිඳේ'' යනුවෙන් ප්‍රකාශ කළේ ය. පියරජතුමාගේ වචන කුමාරයාගේ සිතට තදින් කාවැදිණි. මෙම අවස්ථාවේ කලබල වුවහොත් තමාට ද මරණයට පත්වීමට සිදුවන බව සිතිණි. දෙමවුපියන්ගේ මරණින් පසු ව ද කුමරු අප්‍රසිද්ධියේ ජීවත් විය. සුදුසු කාලය එළඹිණි. තරුණ දීඝායු කුමරු බරණැස් නුවරට පැමිණ බ්‍රහ්මදත්ත රජුගේ ඇත්ගොව්වා සමඟ මිත්‍ර විය. ගී ගැයීමටත්, වීණා වාදනයටත් දක්ෂ දීඝායු කුමරු විසින් හස්ති ශිල්පය ද ඉගෙනගන්නා ලදි. මිහිරි ගී හඬත්, වීණා හඬත් ඇසූ බ්‍රහ්මදත්ත රජු ඉන් මුසපත් විණි. කෙටි කලකින් ම රජු දීඝායු කුමරු තමන්ගේ මිත්‍රයකු බවට පත්කර ගති.

එහෙත් ඔහු දීඝායු කුමරු බව දැනගත්තේ නැත. දිනක් බ්‍රහ්මදත්ත රජතුමා දීඝායු කුමරු සමඟ මුව දඩයමේ පිටත් විය.

බොහෝ වෙහෙසට පත් රජතුමා කුමරුගේ උකුළ මත හිස තබා ගිමන් හැරියේ ය. ටික වේලාවකින් රජතුමා නින්දට වැටිණි. කුමරුට අතීතය සිහි විය. තමන්ගේ මව හා පියා මැරුවේ මේ බ්‍රහ්මදත්ත රජු යැයි සිහියට නැඟිණි.

''මට දැන් පළිගන්න වේලාව ආවා'' යැයි සිතූ සැණින් වහා කඩුව අතට ගත්තේ ය. එවෙලේ ම පියා කියූ වදන් දීඝායු කුමරුගේ මතකයට නැඟිණි. ''පුත දීඝායු, දුර බලන්න. ළඟ නොබලන්න. වෛරයෙන් වෛරය නොසංසිඳේ. අවෛරයෙන් වෛරය සංසිඳේ.'' ඒ වදන් සිහියට නැගුමත් සමඟ කඩුව පහතට හෙළිණි. ඒ මොහොතේ ම බ්‍රහ්මදත්ත රජු සිහිනෙන් බිය වී අවදි විය. රජතුමාගේ ශරීරය පුරා දහඩිය වැගිරිණි. ''ඇයි රජතුමනි, බිය වූවා ද ?'' කුමරු ඇසී ය. ''ඔව් යහළුවා, දීඝතිස්ස කොසොල් රජුගේ දීඝායු නම් පුතකු මගේ ගෙල සිඳ මරා දැමීමට සූදානම් වන බව මා හීනෙන් දුටුවා. ඒකයි මා බිය වුණේ.'' රජතුමාට කියවිණි. එවෙලේ දීඝායු කුමරු තම එක් අතකින් රජුගේ කෙස් වැටිය අල්ලා අනෙක් අතින් කඩුව ගෙන, ''රජතුමනි, මමයි දීඝායු. දීඝතිස්ස කොසොල් රජුගේ පුතා. මට වුවමනා නම් දැන් ඔබ මරා මගේ දෙමාපියන් මැරූ පළිය ගත හැකි යි.'' ප්‍රකාශ කළේ ය. ඒ මොහොතේ බ්‍රහ්මදත්ත රජු දීඝායු කුමරුගේ දෙපා අල්ලා ''අනේ මට ජීවිත දානය දෙන්න'' යැයි ඉල්ලී ය. ''රජතුමනි, බිය නොවන්න. මගේ පියා මට කිව්වේ වෛරයෙන් වෛරය නොසංසිඳෙන බව යි. මට සමා වෙන්න. මම ඔබට ජීවිත දානය දෙමි. මට ද ඔබ ජීවිත දානය දෙන්න'' යනුවෙන් ඉල්ලී ය. ඉන්පසු දෙදෙනා ම රජ මාළිගයට ගොස් ඇමතිවරු රැස් කරවා සියලු පුවත් ඔවුනට කීවෝය. දීඝායු කුමරුට කෝසල රාජ්‍යය පවරා තම දුව ද සරණ පාවා දුන්නේ ය. ඉන් පසු දෙදෙනා ම සමඟියෙන් රාජ්‍ය පාලනය කළහ.

පියවර 2 :
- කතාව ඇසුරින් වාචික ව ප්‍රශ්න කිහිපයක් අසා දරුවන්ගෙන් පිළිතුරු ලබා ගන්න.
- මෙම බුදු වදන සහ එහි අර්ථය පොතේ පිටපත් කරන්නට අවස්ථාව ලබා දෙන්න.
- කතාවේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නඟන්නට සිසුන්ව යොමු කරන්න.

**තක්සේරුව :** • 'සන්තුට්ඨී පරමං ධනං' යන බුදු වදනෙහි අර්ථය ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතය සඳහා**

- නිතර ම සතුටින් කාලය ගත කිරීම
- අන් අයට වෛර නොකර සිටීම.

## 10.0 තේමාව : ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධස්ථාන වන්දනා කිරීම

**නිපුණතාව** : ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධස්ථාන හැඳින ඒවා සුරකිමින් හා අගයමින් වන්දනා කරයි.

**ඉගෙනුම් පල** :
- කැලණි දාගැබ සොළොස්මස්ථාන අතරින් එකක් බව ප්‍රකාශ කරයි.
- දළදා මාලිගාව සම්බන්ධ ඓතිහාසික තොරතුරු දැන ගැනීමට කැමැත්ත පළ කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- විශාල ලෙස සකස් කරගත් කැලණි දාගැබේත්, දළදා මාලිගාවේත් පින්තූරයක්
- පූජනීය ස්ථාන ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි/සංයුක්ත තැටි

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**කැලණි දාගැබ**

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :
- සිසුන් ජීවත් වන ප්‍රදේශයට අදාළ ව පවතින ඓතිහාසික සිද්ධස්ථාන පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- පෙර පන්තිවල දී උගත් ඓතිහාසික සිද්ධස්ථාන පිළිබඳ ව ද දරුවන්ගේ මතකය අවදි කරන්න.

පියවර 2 :
- සංයුක්ත තැටි/රූප රාමු ඇසුරින් පහත කරුණු ද ඇතුළත් කර ගනිමින් කැලණි දාගැබ පිළිබඳ ඓතිහාසික කතාව දරුවන්ට කියා දෙන්න.
  - * ගම්පහ දිස්ත්‍රික්කයට අයත් කැලණිය, කොළඹ සිට කි.මී.10ක් පමණ දුරින් කැලණි නදිය අසබඩ පිහිටා ඇත.
  - * බුදු රජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අටවන වසරේ වෙසක් පුන් පෝ දින තෙවන වර ලංකා ගමනේ දී කැලණියට වැඩම කළහ.
  - * එය සිදු වූයේ මණිඅක්ඛික නා රජු නාගදීපයේ දී බුදුන් වහන්සේට කළ ආරාධනාව අනුව යි.
  - * නා රජු බුදු රජාණන් වහන්සේ ඇතුළු පිරිස් ගෞරවයෙන් පිළිගෙන විශේෂයෙන් ඉදිකරන ලද මණ්ඩපයට කැඳවාගෙනවිත් විශේෂ මැණික් පුටුවේ බුදු රජාණන් වහන්සේ වැඩ හිඳුවී ය. දන් පිළිගන්වා බණ ඇසී ය.
  - * පසු ව බුදු රජුන් වැඩ සිටි මැණික් පුටුව නිදන් කරවා වී ගොඩක හැඩයෙන් යුත් (ධාන්‍යාකාර) චෛත්‍යයක් කරවන ලදි. එය කැලණි චෛත්‍යය යි.
  - * පසු කාලයේ මෙහි බොහෝ විහාරාංග කරවා ඇති බවත්, පැහැදිලි කර දෙන්න. ඓතිහාසික කැලණිය සොළොස්මස්ථානවලින් එකක් බව ද කියා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

පියවර 1 :
- කැලණි දාගැබේ පින්තූර /සංයුක්ත තැටි මඟින් දර්ශනයට සලස්වා කැලණි දාගැබ/චෛත්‍යය වන්දනා කරන්න.
- ඒ සඳහා පහත කවිය යොදා ගන්න.

මණි අක්ඛික රජ ඇරයුම    පිළිගෙන
හිමි බණ දෙසුවා - මිණි පලසක    හිඳ
බුදු හිමි ලක්දිව වැඩි බව    සිහිකොට
කැලණිය දාගැබ වඳිනෙමු    බැතියෙන

- ඒ සඳහා පහත කවිය යොදා ගන්න.

> **කැලණි චෛත්‍යය වන්දනා කරන ගාථාව**
>
> **(කටපාඩම් කිරීම අවශ්‍ය නොවේ.)**
>
> ආයාචනාය මණිඅකකිමහොරගසස
> යස්මිං නිසීදි භගවා මණිමණ්ඩපස්මිං
> තසෙසා පරිට්ඨිත මුපට්ඨිත වීතරාගං
> කල්‍යාණි චෙතියමහං සිරසා නමාමි
>
> තේරුම :
>
> මණිඅක්ඛික නාරජුගේ ආරාධනයෙන් වැඩම කළ සර්වඥයන් වහන්සේ වැඩ සිටි මැණික් මණ්ඩපය පිහිටි තැන ගොඩනඟන ලද කල්‍යාණි චෛත්‍යය වන්දනා කරමි.

**ක්‍රියාකාරකම 3**

- කැලණි දාගැබ චිත්‍රයට නඟා වාක්‍ය කිහිපයක් ලිවීමට සිසුන් යොමු කරන්න.

**දළදා මාළිගාව**

**ක්‍රියාකාරකම 4**

පියවර 1 :
- දළදා මාළිගාව පිළිබඳ සිසුන් දන්නා තොරතුරු අසා දැනගන්න.
- මහනුවර දළදා මන්දිරයෙහි වැඩ හිඳින ශ්‍රී දළදා වහන්සේට අප දක්වන්නේ ජීවමාන බුදු පියාණන් වහන්සේට දක්වන ගෞරවය බව කියා දෙන්න. වර්තමාන දළදා වහන්සේගේ රූප රාමු භාවිත කරන්න.
- ඈත අතීතයේ සිට ම පොදු ජනතාවගේ අතිශය භක්ත්‍යාදරයට පත් ශ්‍රී දළදා වහන්සේ අප සතු උත්තරීතර ම පූජා වස්තුව බව තහවුරු කරන්න.

පියවර 2 :
- කීර්ති ශ්‍රී මේඝවර්ණ රජුගේ රාජ්‍යත්වයෙන් නව වැනි වර්ෂයේ දී ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ ලක්දිවට වැඩම කරවන ලද්දේ හේමමාලා හා දන්ත කුමරු බව රූප රාමු යොදාගෙන පැහැදිලි කරන්න. (ඔවුන් රාජකීයයන් බව කියා දෙන්න.)
- දළදා වහන්සේ ආගමික වස්තුවක්, ජාතික උරුමයක් මෙන් ම අතීත රාජ්‍ය උරුමයේ සංකේතය ද බව පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 5**

පියවර 1 :
- දළදා වහන්සේ පිළිබඳ ඉතිහාස කතා ලියවුණු පොත් රාශියක් ඇති බවත්, (මහා වංශය, ධාතු වංශය, දළදා සිරිත, දළදා පූජාවලිය, රාජාවලිය) එම ග්‍රන්ථවල දළදා වහන්සේ පිළිබඳ තොරතුරු අන්තර්ගත බවත් සාකච්ඡා කරන්න.

පියවර 2 :
- දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ පුවත පින්තූර හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි හෝ ප්‍රදර්ශනය කරමින් සිත් ඇදගන්නා ලෙස සිසුන්ට කියා දෙන්න.
- ඒ සඳහා පහත කරුණු ද එක්කර ගන්න.
  * දඹදිව ගුහසීව රජුගේ බෑනණුවන් වූ දන්ත කුමරුට සමග පැමිණි හේමමාලා කුමරියට ගුහසීව රජු සුව් උපදෙස් පරිදි බමුණු වෙස් ගෙන, දළදා වහන්සේ හේමමාලා කුමරියගේ කෙස් වැටියේ සඟවා ගෙන ලක්දිවට රැගෙන ආ බව
  * රාජකීයයන් දෙදෙනා අනුරාධපුර මේඝගිරිවාසී හිමිනමකට මෙය භාරදුන් බවත්, මේඝගිරි විහාරයේ තබාගෙන පුදපූජා පැවැත්වූ බව

* දළදා වහන්සේ මේඝගිරි විහාරයේ වැඩ සිටින පුවත කිත්සිරි මෙවන් රජුට දන්වා ඇත. රජු අලංකාර රථයක දළදා වහන්සේ වඩාහිඳුවා රජ මාළිගාවට වැඩම කොට ඇත. අනතුරු ව ඇතුළු නුවර ම විහාරයක් තනවා දළදා වහන්සේ එහි වැඩහිඳුවා පූජා පවත්වා ඇති බව
* අනතුරු ව අභයගිරි විහාරයට ද වැඩම කොට ඇති බව
* දළදා වහන්සේ මහනුවරට වැඩම කරවන ලද්දේ පළමු විමලධර්මසූරිය රජතුමා බව හා එතුමා මහනුවර දළදා මාළිගය ද ඉදි කර එහි ශ්‍රී දළදා වහන්සේ තැන්පත් කරන ලද බව
* පසුව දෙවන විමලධර්මසූරිය රජු ද කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද දළදා මාළිගය තව දුරටත් සංවර්ධනය කර ඇති බව
* එදා සිට අද වන තෙක් දළදා වහන්සේ වෙනුවෙන් තේවා පවත්වා උදේ, දවල්, රාත්‍රි පුද පූජා පවත්වන බවත්, අපේ රටේ විවිධ උපද්‍රව (නියඟය, ගංවතුර) අවස්ථාවල දී දළදා වහන්සේට පුද පූජා පවත්වන බව
* උතුම් දළදා වහන්සේ වෙනුවෙන් පූජාවක් පැවැත්වීම උතුම් පින්කමක් බව
* සෑම වර්ෂයක ම ඇසල මාසයේ දළදා පෙරහැර පවත්වමින් දළදා වහන්සේට ගෞරව කරන බව

**ක්‍රියාකාරකම 6**

පියවර 1 :
- දළදා වහන්සේගේ රූප රාමුවක් ප්‍රදර්ශනය කරන්න.
- ශ්‍රී දළදා වහන්සේ වන්දනා කිරීම සඳහා පහත කවිය යොදා ගන්න.

නිර්මල බුදු ගුණ සිහි කරමින්නේ
බුදු බණ දෙසූ ඒ බුදු සමිඳුන්ගේ
උත්තම සිරි දළදා වහන්සේ
දොහොත් මුදුන් දී අප නමඳින්නේ

- නැතහොත් මේ සඳහා වෙනත් පහසු කවියක් යොදා ගන්න.

**ශ්‍රී දළදා වහන්සේ වන්දනා කරන ගාථාව (කටපාඩම් කිරීම අනවශ්‍ය වේ.)**

ලෝකෙක නාථ වදනම් බුජ රාජ හංසං
වෙනෙය්‍යාකො මුදවනං වලි සීතලම්හ
අද්ධින්දු කාර වර රූප විරාජ මානං
වන්දාමි සාදු මමලං ජින දන්ත ධාතුං

*තේරුම* :

'දෙවියන් සහිත ලෝකයාට එකට පිහිට වූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛය නමැති නෙළුම් විලට රාජ හංසයකු වැනි වූ හික්මවිය යුතු ජනයා නමැති කුමුදු විල පුබුදු කරන්නා වූ සඳ වැනි වූ අඩසඳ මෙන් උතුම් රූපයකින් විරාජමාන වූ බුදු රජාණන් වහන්සේගේ නිර්මල වූ වාම ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ මනා කොට වන්දනා කරමි.'

පියවර 2 :
- දළදා මැඳුරේ, දළදා වහන්සේ වැඩ සිටින කරඬුව හෝ දළදා පෙරහැරේ අවස්ථාවක් චිත්‍රයට නඟන්නට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**තක්සේරුව :**
- කැලණි දාගැබ චිත්‍රයට නඟා වාක්‍ය කිහිපයක් ලියයි.
- වර්තමානයේ දළදා වහන්සේ වැඩසිටින ස්ථානය ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතය සඳහා**

- ශ්‍රද්ධාවෙන් යුක්ත ව නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරමින් වන්දනා කටයුතුවල නිරත වීම.
- 'අපේ පුද බිම' නමින් පොත් පිංචක් නිර්මාණය කිරීම.

# බුද්ධ ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව

| | | | | සිසුන්ගේ නම් — තක්සේරු කිරීමේ පරිමාණ: සාර්ථක ව කරයි / දුෂ්කරතා පෙන්නුම් කරයි / • තවදුරටත් උදවු අවශ්‍ය ය. |
|---|---|---|---|---|
| | | | | 1. සිදුහත් කුමරුට පිය රජතුමා විසින් වදින ලද දෙවන අවස්ථාව වාචික ව ප්‍රකාශ කරයි. |
| | | | | 2. සිදුහත් කුමරු උගත් ශිල්ප ලියා දක්වයි. |
| | | | | 3. සුද්ධෝදන රජතුමා පිළිබඳ ව වැකි දෙකක් ලියයි. |
| | | | | 4. බුදු සසුනේ අග්‍ර දායිකා තනතුර ලැබුණේ කාහට දැයි ප්‍රකාශ කරයි. |
| | | | | 5. උඳුවප් පොහෝ දිනයේ වැදගත්කම ප්‍රකාශ කරයි. |
| | | | | 6. පින්තූර ඇසුරින් ගොඩනගා තිත්තිර ජාතක කතාව පවසයි. |
| | | | | 7. නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරමින් බුද්ධ වන්දනාවේ යෙදෙයි. |
| | | | | 8. උපන්දිනය දා කළ හැකි පින්කම් කිහිපයක් නම් කරයි. |
| | | | | 9. පහසුවෙන් නිර්මාණය කළ හැකි බෞද්ධ කලා නිර්මාණයක් සකසයි. |
| | | | | 10. සාමූහික ව එකතු වී ඔසු පැළ නඩත්තු කරයි. |
| | | | | 11. සැම විට ම සත්‍ය වචන කතා කරයි. |
| | | | | 12. පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. |
| | | | | 13. බෞද්ධ උපදේශ කාව්‍යයක් කටපාඩමින් ගායනා කරයි. |
| | | | | 14. අපතේ යන දේවලින් ප්‍රයෝජනවත් යමක් නිර්මාණය කරයි. |
| | | | | 15. පාසල ආරම්භයට පෙර පාසලට පැමිණෙයි. |
| | | | | 16. සලාක දානය පූජා කරන අනුපිළිවෙළ විස්තර කරයි. |
| | | | | 17. මෛත්‍රී භාවනාවෙහි යෙදෙයි. |
| | | | | 18. 'සන්තුට්ඨී පරමං ධනං' යන බුදු වදනෙහි අර්ථය ප්‍රකාශ කරයි. |
| | | | | 19. කැලණි දාගැබ චිත්‍රයට නඟා වාක්‍ය කිහිපයක් ලියයි. |
| | | | | 20. වර්තමානයේ දළදා වහන්සේ වැඩසිටින ස්ථානය ප්‍රකාශ කරයි. |